# 11 ශ්‍රේණිය

# දෙවන බස සිංහල

## ගුරු මාර්ගෝපදේශය

(2016 සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# දෙවන බස

# සිංහල

## ගුරු මාර්ගෝපදේශය

# 11 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

# දෙවන බස
# සිංහල
## ගුරු මාර්ගෝපදේශය

# 11 ශ්‍රේණිය

(2016 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**දෙවන බස**
**සිංහල**

11 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN :....................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**මුද්‍රණය :**

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපෑල** : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

***ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව*** විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කර ගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන් වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : එම්. ජී. මුණසිංහ මහතා
කථිකාචාර්ය

**විෂය විශේෂඥ සහාය** : රත්න විජේතුංග
මහාචාර්ය (විශ්‍රාම)
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

තිස්ස ජයවර්ධන
මහාචාර්ය (විශ්‍රාම)
කොළඹ විශ්ව විද්‍යාලය

**ලේඛක මණ්ඩලය** :

**අභ්‍යන්තර :**

| | | |
|---|---|---|
| ඩී. ඩබ්. දිසානායක මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා | - | කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| කේ. ඥාණවිමල හිමි | - | කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| එම්. ජී. මුණසිංහ මහතා | - | කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩබ්. පී. මංගල ගුණරත්න මහතා | - | සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |
| පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය | - | සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය |

**බාහිර :**

| | | |
|---|---|---|
| ආර්. ඒ. සුනීකා මහත්මිය | - | නියෝජ්‍ය කොමසාරිස් (විශ්‍රාමික) |
| පී. වී. සෙල්වරාජ් මහතා | - | විද්‍යාපීඨ කථිකාචාර්ය, (විශ්‍රාමික) |
| එච්. එල්. හරිස්චන්ද්‍ර මහතා | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ |
| ධම්මිකා කරල්ලියද්ද මෙනවිය | - | ගුරු සේවය |
| එම්. එච්. එම්. ෆාරුක් මහතා | - | ගුරු සේවය |
| පී. අශෝක් කුමාර් මහතා | - | ගුරු සේවය |

**භාෂා සංස්කරණය** : සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහාය** : අනුලා නන්දනී රාජපක්ෂ මහත්මිය
නිලූපා අබේරත්න මහත්මිය
උපාලි ජයලත් මහතා

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

ගුරු මාර්ගෝපදේශය ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඵලදායීතාව වැඩි කිරීම සඳහා මග පෙන් වනු ලබයි. ගුරුවරයාට වඩාත් පහසුවෙන් නිපුණතාවත්, නිපුණතා මට්ටමටත්, ඊට අදාළ පාඩමත් හඳුනා ගෙන ඉගැන්වීම් කාර්යයයේ නියැලීමට ඉඩ සැලසේ. ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද, උපකරණ අමතර ක්‍රියාකාරකම් මෙහි අන්තර්ගත ව ඇත.

විශේෂයෙන් ම **සවන් දීම, කථනය, කියවීම, ලිවීම** යන චතුර්විධ භාෂා කුසලතා වර්ධනය මූලික වශයෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී භාෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් භාෂා හැකියා පුළුල් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත.

මෙහි **මූලික වදන්** මගින් පෙළ පොතේ පාඩමට අදාළ වාක් කෝෂය පෝෂණය කිරීමට වැඩි අවකාශයක් ලබා දී ඇත. ඒ සඳහා දරුවන්ගේ භාෂණ හැකියාව සංවර්ධනය කිරීමට **පුහුණුව** සඳහා යොදා ගත යුතු භාෂණ රටා ඇතුළත් කර තිබේ. ඒවා හැකිතාක් භාවිත කරමින් පන්ති කාමරයේ දී ශිෂ්‍යයන් කතා කරවීමට පෙලඹ විය යුතු ය. ඊට අදාළ ක්‍රියාකාරකම්හි වැඩි වැඩියෙන් නිරත කරවීම සඳහා ඔබගේ අත්දැකීම් ද පාදක කර ගනිමින් පන්ති කාමරයේ සිටින ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන අයුරින් මෙම ක්‍රමවේද තවත් සරල කර ගනිමින් අවශ්‍ය අවස්ථාවල දී සංයුක්ත තැටි, හඬ පට, ගීත, ඡායාරූප, පින්තූර ආදි වඩාත් උචිත ක්‍රමවේද යොදා ගත හැකි ය. එසේ ම පාඩම් සැලසුම් සඳහා ලබා දී ඇති උපදෙස් ද සැලකිල්ලට ගෙන වඩාත් ආකර්ෂණීය ලෙස පාඩම් සැලසුම් කිරීමට ගුරුවරයාට අවස්ථාව සැලසෙනු ඇත.

මෙහි ඇති වඩාත් සුවිශේෂ කරුණ වන්නේ අදාළ පාඩම අවසානයේ ශිෂ්‍යයා අත් පත් කර ගත යුතු දේ ඉගෙනුම් පල ලෙස දක්වා තිබීමයි. එම කුසලතා ශිෂ්‍යයන්ගෙන් මතු කර ගැනීමට නිරතුරුව ම ඔබ වගබලා ගත යුතු ය. ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති නිර්ණායක මගින් ශිෂ්‍යයන්ගේ ප්‍රබලතා හා දුබලතා හඳුනා ගෙන ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට හැකියාව ලැබේ. මෙම ගුරු මාර්ගෝපදේශය පරිශිලනය කරමින් ඔබේ අත්දැකීම ද ඒ සඳහා සුදුසු පරිදි යොදා ගෙන පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට මෙය මහෝපකාරී වනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමු.

ලේඛක මණ්ඩලය

# පටුන


| | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| හැඳින්වීම | viii |
| ජාතික අරමුණු | ix - x |
| මූලික නිපුණතා | xi-xii |
| විෂයයේ අරමුණු | xiii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | xiv - xxxiv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01 - 50 |

# හැඳින්වීම

සමාජය නො කැඩී නො බිඳී පවතින්නේ පුද්ගලයන් අතර පවතින හොඳහිත සහ සුහදතාව නිසා ය. එබැවින් සමාජය නො කැඩෙන සේ නො බිඳෙන සේ පවත්වා ගැනීමේ අරමුණ සාමාජිකයන් අතර දැඩි ලෙස පැවතිය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට මූලාධාර වන්නේ මනුෂ්‍යයා සමාජ ගත වීම සඳහා යොදා ගන්නා ප්‍රබලතම උපකරණය වන භාෂාව යි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රාථමික අවධියේ සිට සිංහල/දමිළ භාෂා දෙකින් එක් භාෂාවක් දෙවන බස ලෙස හැදෑරීම අනිවාර්ය ව පවතී. තම අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම මගින් සාධනීය ආකල්ප ගොඩනගා ගැනීමට මෙහි දී අවස්ථාව උදා කර දී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් භාෂාවක් භාවිත කිරීමට පුද්ගලයා සතු දෙයාකාර භාෂා ශක්‍යතා අතරින් භාෂණ ශක්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දෙවන බස සිංහල විෂයමාලාව සැලසුම් කොට ඇත.

මේ සම්බන්ධයෙන් පසුගිය විෂයමාලා ප්‍රතිසංස්කරණ හා ඒ අනුසාරයෙන් සැකසුණු පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණයන් ද ලොව විවිධ රටවල භාවිත කෙරෙන බොහොමයක් විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන්නට යෙදුණි. එහි දී නොයෙක් පාර්ශවයන්ගේ අවධානයට බඳුන් වූ **"පොදු යුරෝපියානු ආදර්ශනය"** (The Common European Framework of Reference for Languages (CEFR) කෙරෙහි සැලකිල්ල යොමු විය. **එහි හරය සහ ආකෘතික රාමුව** ගැන විශේෂ යොමු වීමක් සිදු විය. එහි දී දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට උදව් වන ලෙස හෙළ බසේ ගති සොබා හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දක්වමින් දෙවන බස සිංහල විෂයමාලාව සකසා ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003 දෙසැම්බර්)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්,අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

| | | |
|---|---|---|
| ජෛව පරිසරය | : | සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා. |
| භෞතික පරිසරය | : | අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව |

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## විෂයයේ අරමුණු

1. **ශබ්ද උච්චාරණ රටා**
ශබ්ද උච්චාරණ රටා, ශ්‍රවණ අත්දැකීම් සහ භාෂා රටා අනුකරණාත්මක ව හැසිරවීමේ හුරුව ඇති කර ගැනීම.

2. **ශ්‍රවණ සංයමය හා අවධානය**
විවිධතා හඳුනා ගනිමින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ඇති කර ගැනීම.

3. **ස්මරණය**
මතකය අවදි කර ගනිමින් අලුත් යමක් නිපදවීමේ ශක්තීන් ගොඩනගා ගැනීම.

4. **වින්දනය හා සුහදතාව**
අසා රස විඳිමින් ප්‍රසන්න සහ සුන්දර සිතිවිලි මගින් මානව දයාව, සුහදතාව ගොඩනැගීම.

5. **භාවිත රටා හුරුව**
භාෂා රීතිවලට අනුගත ව භාෂාව භාවිත කිරීමේ හුරුව සහ සිංහල අත් අකුරු නිවැරදි ව, ක්‍රමවත් ව, පැහැදිලි ව ලිවීමේ හුරුව ඇති කර ගැනීම.

6. **වාක්කෝෂ හැකියාව**
බස්වහර හඳුනා ගනිමින් අන්තර්ගත වචන රැස් කරමින් ඒවා සුදුසු ලෙස භාවිත කිරීමේ හුරුව ඇති කර ගැනීම.

7. **ආකල්ප ගොඩනැගීම**
උත්සව අවස්ථා, සිරිත් විරිත්, පරිභෝජන රටා, ගණන් මිනුම් පිළිබඳ හෙළබසේ ගති සොබා අනුව සිංහල සංස්කෘතියෙහි හැඩරුව හඳුනා ගනිමින් සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දායක වීම.

8. **විෂය නිර්දේශයේ අරමුණු**
- විවිධ ප්‍රායෝගික කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාෂා සම්මතයන්ට (රීති) අනුව භාෂා භාවිතය පිළිබඳ ව හුරුව ලබා ගැනීම.
- සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම සඳහා යහපත් ආකල්ප හා පුරුදු සංවර්ධනය කර ගැනීම.
- පුරවැසියෙකු ලෙස සියලු ප්‍රතිලාභ අත්විඳීම උදෙසා දේශීය වශයෙන් වෘත්තීය ප්‍රස්තාවන් සඵල කර ගැනීම සඳහා භාෂා ප්‍රවීණතාවක් ඇති කර ගැනීම.

# දෙවන බස සිංහල

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
:www nie.lk

## 1.0 හැඳින්වීම

සමාජය නො කැඩී නො බිඳී පවතින්නේ පුද්ගලයන් අතර පවතින හොඳහිත සහ සුහදතාව නිසා ය. එබැවින් සමාජය නොකැඩෙන සේ නොබිඳෙන සේ පවත්වා ගැනීමේ අරමුණ සාමාජිකයන් අතර දැඩි ලෙස පැවතිය යුතු ය. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට මූලාධාර වන්නේ මනුෂ්‍යයා සමාජගත වීම සඳහා යොදා ගන්නා ප්‍රබලතම උපකරණය වන භාෂාව යි.

ශ්‍රී ලංකාවේ පවතින භාෂා ප්‍රතිපත්තිය අනුව ප්‍රාථමික අවධියේ සිට සිංහල/දමිළ භාෂා දෙකින් එක් භාෂාවක් දෙවන බස ලෙස හැදෑරීම අනිවාර්ය ව පවතී. තම අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතියක් වශයෙන් භාෂා ප්‍රජාවක් ලෙස කටයුතු කිරීම මගින් සාධනීය ආකල්ප ගොඩනගා ගැනීමට මෙහි දී අවස්ථාව උදා කර දී ඇත. එය යථාර්ථයක් බවට පත් කරමින් භාෂාවක් භාවිත කිරීමට පුද්ගලයා සතු දෙයාකාර භාෂා ශක්‍යතා අතරින් භාෂණ ශක්‍යතාවට ප්‍රමුඛතාව දෙමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා දෙවන බස සිංහල විෂයමාලාව සැලසුම් කොට ඇත.

මේ සම්බන්ධයෙන් පසුගිය විෂයමාලා ප්‍රතිසංස්කරණ හා ඒ අනුසාරයෙන් සැකසුණු පන්ති කාමර ක්‍රියාවලිය පිළිබඳ සිදු කළ පර්යේෂණ අනාවරණයන් ද ලොව විවිධ රටවල භාවිත කෙරෙන බොහොමයක් විෂය නිර්දේශ ද අධ්‍යයනය කරන්නට යෙදුණි. එහි දී නොයෙක් පාර්ශවයන්ගේ අවධානයට බඳුන් වූ **"පොදු යුරෝපියානු ආදර්ශනය"** (The Common European Framework of Reference for Languages (CEFR) කෙරෙහි සැලකිල්ල යොමු විය. **එහි හරය සහ ආකෘතික රාමුව** ගැන විශේෂ යොමු වීමක් සිදු විය. එහි දී දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට උදව් වන ලෙස හෙළ බසේ ගති සොබා හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දක්වමින් දෙවන බස සිංහල විෂයමාලාව සකසා ඇත.

## 2.0 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව 2003 දෙසැම්බර්)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදිතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

## 4.0 විෂය අරමුණු

1. **ශබ්ද උච්චාරණ රටා**
   ශබ්ද උච්චාරණ රටා, ශ්‍රවණ අත්දැකීම් සහ භාෂා රටා අනුකරණාත්මක ව හැසිරවීමේ හුරුව ඇති කර ගැනීම.

2. **ශ්‍රවණ සංයමය හා අවධානය**
   විවිධතා හඳුනා ගනිමින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කිරීමේ ශක්තිය ඇති කර ගැනීම.

3. **ස්මරණය**
   මතකය අවදි කර ගනිමින් අලුත් යමක් නිපදවීමේ ශක්තීන් ගොඩනගා ගැනීම.

4. **වින්දනය හා සුභදතාව**
   අසා රස විඳිමින් ප්‍රසන්න සහ සුන්දර සිතිවිලි මගින් මානව දයාව, සුභදතාව ගොඩනැගීම.

5. **භාවිත රටා හුරුව**
   භාෂා රීතිවලට අනුගත ව භාෂාව භාවිත කිරීමේ හුරුව සහ සිංහල අත් අකුරු නිවැරදි ව, ක්‍රමවත් ව, පැහැදිලි ව ලිවීමේ හුරුව ඇති කර ගැනීම.

6. **වාක්කෝෂ හැකියාව**
   බස්වහර හඳුනා ගනිමින් අන්තර්ගත වචන රැස් කරමින් ඒවා සුදුසු ලෙස භාවිත කිරීමේ හුරුව ඇති කර ගැනීම.

7. **ආකල්ප ගොඩනැගීම**
   උත්සව අවස්ථා, සිරිත් විරිත්, පරිභෝජන රටා, ගණන් මිනුම් පිළිබඳ හෙළබසේ ගති සොබා අනුව සිංහල සංස්කෘතියෙහි හැඩරුව හඳුනා ගනිමින් සමාජ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට දායක වීම.

8. **විෂය නිර්දේශයේ අරමුණු**

   - විවිධ ප්‍රායෝගික කාර්යයන් ඉටුකර ගැනීම සඳහා භාෂා සම්මතයන්ට (රීති) අනුව භාෂා භාවිතය පිළිබඳ ව හුරුව ලබා ගැනීම.
   - සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම් හා අගයයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකේය ජාතියක් ගොඩනැගීම සඳහා යහපත් ආකල්ප හා පුරුදු සංවර්ධනය කර ගැනීම.
   - පුරවැසියෙකු ලෙස සියලු ප්‍රතිලාභ අත්විඳීම උදෙසා දේශීය වශයෙන් වෘත්තීය ප්‍රස්තාවන් සඵල කර ගැනීම සඳහා භාෂා ප්‍රවීණතාවක් ඇති කර ගැනීම.

# දෙවන බස සිංහල
# විෂය නිර්දේශය
# 11 ශ්‍රේණිය

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **විෂය අන්තර්ගතය** | **ඉගෙනුම් පල** | **කාලච්ඡේද සංඛ්‍යාව** |
| 1.0<br>එදිනෙදා පොදු අවස්ථා හා සිදු විය හැකි අවස්ථා පිළිබඳ සමීප බස්වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Texts) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි. | 1.1<br>සුහද කතා බහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • ප්‍රජා ශාලාව වර්ණාලේප කර පිරිසිදු කිරීම.<br>(சனசமூக நிலையம்) மண்டபத்தை துப்பரவு செய்து நிறப்பூச்சு பூசுதல்.<br>- ඉස්සර<br>- ඒ කාලේ<br>- නැවත<br>- සිකුරාදා, සෙනසුරාදා<br>- පරණ බිත්ති<br><br>කහ පාට<br>සුදු පාට<br>තීන්ත<br>බුරුසුව<br>බාල්දිය<br><br>ඇතුළු පැත්තට<br>පිට පැත්තට<br>වැස්සට<br>අව්වට | • සුහද කතාබස්වලට අවධානයෙන් සවන් දී අවස්ථාව ප්‍රකාශ කරයි.<br><br>• අලුත් වචන හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br><br>• සුහද කතා බස්වලට සවන් දී අවස්ථාවට සුදුසු පරිදි ප්‍රතිචාර දක්වයි. | 04 |

| සවන්දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.2<br>උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • ගංවතුර අවස්ථාවක දී ජීවිත බේරා ගැනීමට දෙන උපදෙස් (බෝට්ටුවකින් යන අවස්ථාවක්)<br><br>வெள்ளப்பெருக்கு ஏற்பட்ட சந்தர்ப்பத்தில் உயிர்களை பாதுகாத்துக் கொள்வதற் காக கொடுக்கப்படும் அறிவுறுத்தல்கள் (படகொன்றில் செல்லும் சந்தர்ப்பம்)<br><br>- බෝට්ටුව<br>- ආරක්ෂක කබාය<br>- ගංවතුර<br>- නාවික හමුදාව<br>- පොලීසිය<br>- රජය<br>- ගෙවල්<br>- පැළඳ ගන්න.<br>- ඇවිදින්න එපා.<br>- උදව් කරන්න. | • අවධානයෙන් සවන් දී අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br><br>• ප්‍රධාන උපදෙස් හඳුනා-ගෙන ඉදිරිපත් කරයි.<br><br>• දෙන ලද උපදෙස්වලට නිවැරදි ප්‍රතිචාර දක්වයි. | 03 |

| සවන්දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.3<br>යමක් පිළිබඳ විමසීම්වලට හා මග විමසීම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • පාසල් නිවාඩු කාලයේ දී විනෝද විය හැකි ස්ථානයක් (සත්තුවත්ත) නැරඹීමට විස්තර තොරතුරු විමසීම.<br>பாடசாலை விடுமுறை காலத்தில் கண்டு களிக்கும் இடமொன்று. (மிருகக் காட்சிசாலையை பார்வையிடு வதற்கான விபரங்களை கேட்டல்)<br><br>මේ සැරේ<br>ලබන සුමානේ<br>සඳුදා ඉඳලා<br><br>මේ / ඔය / අර / ඒ } පොත<br><br>නිවාඩු කොහොම ද?<br>කීය ද?<br>යන්නේ කොහේ ද?<br>කීයක් වෙනව ද?<br>සෙනඟ වැඩියි නේ ද?<br>කොච්චර වෙලාවක් ඉන්න වේවි ද?<br>තියෙන්නෙ කීයට ද?<br><br>සත්තුවත්ත<br>සත්තු<br>මින් මැදුර<br>අලි සෙල්ලම්<br>ප්‍රවේශ පත්‍ර<br>(සතුන්ගේ නම් කිහිපයක්) | • මග විමසීම්වලට අවධාන-යෙන් සවන් දී තොරතුරු ඉදිරිපත් කරයි.<br><br>• මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>• අදාළ වචන භාවිත කරමින් මග විමසීම් කරයි. | 03 |

| සවන් දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.4<br>නිවේදනවලට සවන් දෙයි.<br>ප්‍රතිචාර දක්වයි. | • කාලගුණ නිවේදනයක්<br>(තද සුළං සහිත වැසි තත්ත්වයක්)<br>வானிலை அறிவிப்பொன்று<br>(கடுமையான காற்றுடனான மழை)<br><br>කාලගුණය<br>කාලගුණ දෙපාර්තමේන්තුව<br>අකුණු<br>තද සුළං<br>බටහිර මුහුද<br>ගං වතුර<br>ධීවර ජනතාව<br>දිවයින<br>වලාකුළු<br>දිශාව<br><br>උදය කාලය<br>දවල් කාලය<br>රාත්‍රී කාලය<br>දවස ම<br><br>වළකිනවා.<br>පවතිනවා.<br>හමනවා.<br>ඉල්ලා සිටිනවා. | • අවධානයෙන් සවන් දී නිවේදනයෙන් කියවෙන පණිවිඩය ප්‍රකාශ කරයි.<br><br>• නිවේදනයෙන් ග්‍රහණය කරගත් අලුත් වචන ඉදිරිපත් කරයි.<br><br>• නිවේදනයක තිබෙන මූලික ලක්ෂණ පැහැදිලි කරයි.<br><br>• නිවේදනය තේරුම්ගෙන ප්‍රතිචාර දක්වයි. | 04 |

| සවන්දීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 1.5<br>ගුවන් විදුලි ප්‍රචාර හා පටිගත කිරීම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි. | • ළමා කතන්දරයක්,<br>(බෙරය හා හිවලා – පංච තන්ත්‍රය)<br><br>சிறுவர் கதையொன்று.<br>(நரியும் மேளமும்)<br><br>වනාන්තරය<br>ආහාර<br>ශබ්දයක්<br>සිදුරක්<br>පඳුරු අස්සෙ<br><br>බැලුවා.<br>හපලා.<br>හොයලා.<br>කැඩුණා.<br>ඇහුණා. | • කතන්දරයට අවධානයෙන් සවන් දී කතාව කෙටියෙන් කියයි.<br><br>• කතන්දරයේ ඇතුළත් රසවත් සිද්ධි හා අවස්ථා ඉස්මතු කර දක්වයි.<br><br>• කතන්දරයේ අවස්ථා හා සිද්ධි සිහි ගන්වමින් රස විඳියි. | 04 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| **2.0**<br>පොදු සිදුවිය හැකි හා කාල්පනික, විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි. | **2.1**<br>උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි. | • ''චැනල් සේවාව'' මගින් වෛද්‍යවරයකු වෙන් කර ගැනීමේ දී ලැබෙන උපදෙස්<br>“சேனல் சேவை” ஊடாக வைத்தியர் ஒருவரை சந்திப்பதற்காக நேரத்தை ஒதுக்கிக்கொள்ளும் போது கிடைக் கின்ற அறிவுறுத்தல்கள்<br><br>චැනල් සේවාව<br>වෛද්‍යවරයා<br>වේලාවක්<br>රෝගියා<br>මුදල්<br><br>අංකය වෙන් කර ගන්න.<br>ගෙවන්න.<br>හමුවන්න.<br>දැනගන්න.<br>අය කරනවා.<br><br>පුළුවන් ද?<br>කීය ද?<br>කීයට ද? | • උපදෙස් සහිත වාක්‍ය හඳුනා ගෙන කියයි.<br>• උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී ප්‍රශ්න අසමින් ඒවාට මැදිහත් වී කටයුතු කරයි.<br>• උපදෙස්වලට ප්‍රතිචාර දක්වමින් තම අවශ්‍යතා ඉටුකර ගනියි. | 04 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.2<br>මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි. | • විනෝද චාරිකාවක දී නැරඹීමට යන ස්ථාන පිළිබඳ කරනු ලබන විමසීමක් (දුරකථනයෙන් විමසීම.)<br>சுற்றுலாவொன்றின் போது கண்டு களிக்கப் போகும் இடங்களைப் பற்றி கேட்டறிதல்.<br><br>වරාය නැරඹීමට යාම.<br>(නැරඹිය හැකි දේවල්, ආහාර පාන ලබා ගත හැකි ස්ථාන, නවාතැන් පහසුකම්)<br><br>ප්‍රවේශ පත්‍ර<br>ආහාර පාන<br>වරාය<br>ජැටිය<br>බඩු නැව්<br>ගබඩා සංකීර්ණය<br>තෙල් ටැංකි<br>අවට පරිසරය<br>හෝටල්<br>නවාතැන් පහසුකම්<br><br>නවතින්න පුළුවන් — ඕනෑ.<br>ගිහින් තියෙනවා ද? — එපා.<br>පහසුකම් තියෙනවා ද? — පුළුවන්.<br>හුගක් ගෙවන්න ඕනැ ද? | • මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අදාළ වචන භාවිත කරමින් මග විමසීම් කිරීමට මැදිහත් වේ.<br>• තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා මග විමසීම් කරයි. | 04 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.3<br>සුහද සංවාදවල දී මැදිහත් වෙයි. | • සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම.<br>(දෙවන බස සිංහල පාඨමාලාවක් හැදෑරීම සඳහා)<br><br>நேர்முகப் பரீட்சையொன்றுக்கு தோற்றுதல்.<br>(இரண்டாம் மொழி - சிங்களம் - பாடநெறியொன்றை கற்பதற்கான)<br><br>පාඨමාලාව<br>ප්‍රයෝජන<br>යහළුවා<br>රැකියාව<br>පන්තිය<br>ටිකක්<br>ගොඩක්<br>ආශාව<br>උදවුව<br>ඉගෙනීම | • දෙන ලද අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ප්‍රායෝගික අවස්ථාවකට මැදිහත් වෙමින් සංවාදවල යෙදෙයි.<br>• සුහද සංවාදවල දී ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව ප්‍රතිචාර දක්වයි. | 04 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.4<br>තොරතුරු හුවමාරු කර ගැනීමේ දී මැදිහත් වෙයි. | • වෘත්තීය පුහුණු පාඨමාලාවක් පිළිබඳ තොරතුරු විමසීම.<br><br>தொழில் பயிற்சி நெறியொன்று சம்பந்த மாக விபரங்களை கேட்டறிதல்.<br><br>තොරතුරු<br>කතා කරන්න පුළුවන්<br>රැකියාව<br>කියන්න පුළුවන් ද?<br>සුදුසුකම්<br>කාලයක් තියෙනවා ද?<br>ගාස්තුව<br>තියෙනවා ද?<br>යොමු කරනවා<br>මොන දවස්වලට ද? | • තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ප්‍රශ්න කරයි.<br>• අදාළ තොරතුරු ලබා-ගැනීම සඳහා ඉදිරිපත් වී කටයුතු කරයි.<br>• නිරවුල් ව හා පැහැදිලි ව අදහස් හුවමාරු කර ගනියි.<br>• තොරතුරු හුවමාරු කර ගනිමින් අවශ්‍යතා ඉටු කර ගනියි. | 03 |

| කථනය - මැදිහත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.5<br>ගනුදෙනුවල දී මැදිහත් වෙයි. | • ප්‍රජා ශාලාව වර්ණාලේප කිරීම සඳහා තීන්ත මිල දී ගන්නා අවස්ථාවක්<br>சனசமூக நிலைய கட்டிடத்தை நிறப் பூச்சு பூசுவதற்காக நிறச்சாயம் கொள் வனவு செய்யும் சந்தர்ப்பமொன்று.<br>කහ පාට<br>සුදු පාට<br>තද පාටක්<br>ලා පාටක්<br>ප්‍රජා ශාලාව<br>තීන්ත<br>ලීටර්,<br>දිය කරමු.<br>එකතු කරමු.<br>බෙදා ගනිමු.<br>ගාන්න.<br>දිය කරන්න. | • ගනුදෙනුවල දී භාවිත වන වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• එම වචන භාවිත කරමින් ගනුදෙනුවලට මැදිහත් වී කටයුතු කරයි.<br>• විවිධ ගනුදෙනුවලට සහභාගි වෙමින් කටයුතු කරයි. | 03 |
| | 2.6<br>සාකච්ඡාවල දී මැදිහත් වෙයි. | •(පන්සලක දී කෙරෙන සාකච්ඡාවක්) මත් උවදුර දුරු කිරීමේ පෙරහැරක් සංවිධානය කිරීම.<br>ஊர்வலமொன்று ஒழுங்கு செய்தல்.<br>(போதைப் பொருள் பாவனையை ஒளிப் பதற்கான)<br>හාමුදුරුවෝ<br>දෙමව්පියෝ<br>මන්ත්‍රී තුමා<br>පූජක තුමා<br>විදුහල්පති තුමා<br>වෙළඳ<br>ව්‍යාපාරිකයන්<br>පන්සල<br>දැනුවත් කරනවා.<br>උපදෙස් දෙනවා.<br>සංවිධානය කරනවා.<br>පෙරහැර<br>සංවිධායක කමිටුව<br>ප්‍රථමාධාර<br>සැරසිලි<br>සංග්‍රහ කිරීම | • උත්සව සංවිධානය කිරීම සඳහා සහභාගි වෙයි.<br>• සාකච්ඡාවලට මැදිහත් වී අදහස් ඉදිරිපත් කරයි.<br>• උත්සවයක් සංවිධානය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 03 |

| කථනය - ඉදිරිපත්වීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 2.7<br>කෙටි සරල වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි. | • දෙවන බස සිංහල හදාරන ශිෂ්‍යයින් විසින් සංවිධානය කරන ලද සිංහල අලුත් අවුරුදු උත්සවයක ක්‍රීඩා පිළිබඳ සජීව විස්තර කථනයක්.<br>இரண்டாம் மொழி - சிங்கள பாடத்தை கற்கும் மாணவர்களால் சிங்கள புத்தாண்டு விழாவின் போது நடை பெறும் விளையாட்டுக்களின் நேர்முக வருணனை.<br>සිංහල අලුත් අවුරුද්දේ පැවැත්වෙන ක්‍රීඩා<br>1. කණා මුට්ටිය බිඳීම.<br>2. ලිස්සන ගහේ නැගීම.<br>(මේවායින් එකක් ප්‍රමාණවත්)<br>සිංහල අලුත් අවුරුද්දේ පැවැත්වෙන ක්‍රීඩා<br><br>කණා මුට්ටිය<br>රෙදි කෑල්ල<br>මුට්ටිය<br>එල්ලනවා.<br>පෝලිමක් හැදෙනවා<br>ඇස් බඳිනවා.<br>රවුම් තුනක් කරකවනවා<br>පොල්ලක් දෙනවා.<br>ගැහැනු<br>පිරිමි<br>තරගකරුවන්<br>තරග කොන්දේසි<br><br>පුවක් ගහක්<br>කොඩිය<br>ග්‍රීස් ගානවා.<br>හිටවනවා.<br>ගන්නවා.<br>ලිස්සනවා.<br>මුදුනට නගිනවා.<br>ඇඟේ ගෑවෙනවා.<br>පිහ දානවා.<br>සහභාගි වෙන්න.<br>විවෘත තරගයක්<br>දිනනවා. | • ඉදිරිපත් කිරීමට සූදානම් වන අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• අවස්ථාවට ගැළපෙන පරිදි කරුණු සංවිධානය කරයි.<br>• උචිත වචන භාවිත කරමින් වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි. | 03 |

| කියවීම හා නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| 3.0<br>එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන ද සමීප හා නුහුරු කතාබස්වලින් i el i bK qúúO mdG ^Texts) අවබෝධයෙන් කියවා **ප්‍රතිචාර දක්වමින්** ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි. | 3.1<br>**ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි.** | • යාපනයට අධිවේගී මාර්ගයක් (පුවත් පත් ලිපියක්)<br>யாழ்ப்பாணத்துக்கு அதிவேக பாதை. (பத்திரிகை ஆக்கமொன்று)<br>මංතීරු<br>පළල<br>කෙටි<br>කිලෝමීටර්<br>ගුවන් පාලම්<br>උමං<br>මාර්ග සංඥා<br>වාහන<br>දැන්වීම් පුවරු<br>ප්‍රවේශ වීම<br>පිටවීම<br>අනතුරු<br>වේග සීමා<br>මාර්ග නීති<br>නගර<br>ප්‍රවේශ පත්‍ර<br>මුදල් ගෙවීම<br>ගාස්තු<br>උතුරු පළාත<br>ශීඝ්‍ර සංවර්ධනයක් | • පුවත් පත් වාර්තාවක්/ ලිපියක් කියවා එහි අදහස කෙටියෙන් ප්‍රකාශ කරයි.<br>• පුවත් පත් වාර්තාවක පින්තූර බලා තොරතුරු පැහැදිලි කරයි.<br>• විවිධ ලේඛන අවබෝධයෙන් කියවා තොරතුරු ප්‍රකාශ කරයි. ඉදිරිපත් කරයි. | 03 |

| කියවීම හා නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.2<br>සාහිත්‍යමය පාඨ කියවයි.<br>නිරීක්ෂණය කරයි. | • දේශාභිමානි ගීතයක්<br>தேசப் பற்றை வெளிப்படுத்தும் பாடல<br><br>මේ රට මගෙ රට<br>මා ඉපදුණ රට<br>හැදෙන වැඩෙන රට<br>මගේ ම මව් රට<br><br>සරුපස පොළවෙන්<br>වැහි බිඳු අහසෙන්<br>මිණි කැට මුතු කැට<br>ඇත මගෙ සිරිලක<br><br>මගෙ සිරිලක ගැන<br>ලොවට කියමි මම<br>සුරපුරයක් වෙන<br>ලොවේ මෙවැනි නැත<br><br>එඩිතර කම ඇති<br>කම්මැලි කම නැති<br>ළමයි සිටින රට<br>මගෙ මේ සිරිලක<br><br>පද රචනය - මිරැන්ඩා හේමලතා | • ගීතය අනුකරණය කරමින් ගායනා කරයි.<br>• ගීතයේ සරල අදහස තේරුම් ගෙන ප්‍රකාශ කරයි.<br>• ගීතය අර්ථාවබෝධයෙන් යුතු ව ගයමින් රස විඳියි. | 03 |

| කියවීම හා නැරඹීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 3.3<br>උපදෙස් කියවයි. නරඹයි. | • ස්වයංක්‍රීය මුදල් ලබා ගැනීමට උපදෙස් ((ATM) කාඩ්පතක් භාවිතයට උපදෙස්) வங்கியின் ATM இயந்திரம் ஊடாக பணம் பெறுவதற்கான அறிவுரை. (ATM அட்டை உபயோகத்துக்கான அறிவுறுத்தல்கள்)<br>- කාඩ්පත ඇතුළු කරන්න.<br>- රහස් අංකය සටහන් කරන්න. ඔබගේ අවශ්‍යතාව තෝරාගන්න.<br>- කවර ගිණුමක් දැයි දක්වන්න.<br>- ජංගම ගිණුමෙන් ද? ඉතිරිකිරීමේ ගිණුමෙන් ද?<br>- මුදල සඳහන් කරන්න. මුදල නිවැරදි යි. මුදල වැරදි යි.<br>- ගිණුම පිරික්සන තුරු මඳක් රැඳී සිටින්න.<br>- මුදල් ඉවත් කර ගන්න.<br>- ඔබගේ කාඩ්පත නැවත ලබා ගන්න.<br>- ස්තුතියි. | • සවිස්තර උපදෙස් නිරීක්ෂණය කර කියවයි.<br>• උපදෙස් අනුව කටයුතු කරයි.<br>• කාඩ්පත් භාවිතයෙන් එදිනෙදා තම අවශ්‍යතා ඉටුකර ගනියි. | 03 |
| | 3.4<br>ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ (Audio Visual Texts) හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි. | • පුවත් පත් - සිරස්තල කියවීම<br>செய்தித்தாள் (நாளிதழ்) தலைப்புக் களை வாசித்தல்.<br>- ප්‍රධාන පිටුවේ ඇති සිරස්තල<br>- විවිධ කාලගුණ තොරතුරු<br>- ක්‍රීඩා තොරතුරු<br>- විදෙස් පුවත් | • පුවත් පතක ප්‍රධාන පින්තූර බලා සිරස්තල කියවයි.<br>• සිරස්තලවලට අදාළ තොරතුරු ප්‍රකාශ කරයි.<br>• විවිධ සිරස්තල කියවයි. | 03 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **විෂය අන්තර්ගතය** | **ඉගෙනුම් පල** | **කාලච්ඡේද සංඛ්‍යාව** |
| 4.0<br>පොදු, සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන (සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු) කෙටි සරල ගළපන ලද පාඨ ලියයි. | 4.1<br>විස්තර පාඨ ලියයි. | • අපේ ගෙවතු වගාව<br>எமது வீட்டுத்தோட்ட பயிர்செய்கை<br>ඇට<br>පැළ<br>එළවළු<br>මෑ<br>කරවිල<br>වැටකොළු<br>වම්බටු<br>බණ්ඩක්කා<br>පලතුරු<br>පේර<br>අඹ<br>ගස් ලබු<br>උදලු ගානවා.<br>සුද්ද කරනවා.<br>කාණු කපනවා.<br>වළවල් හාරනවා. | • මාතෘකාවකට අනුව කරුණු පෙළ ගස්වයි.<br>• මාතෘකාවට අදාළ ව විස්තර පාඨ ලියයි.<br>• මාතෘකානුකූල ව රචනා ලියයි. | 03 |
| | 4.2<br>නිර්මාණාත්මක පාඨ ලියයි. | විනෝද චාරිකාවක දී නැරඹීමට ගිය ස්ථාන<br>சுற்றுலாவொன்றின் போது பார்க்கச் சென்ற இடங்கள் தொடர்பான விபரம்<br>යාල අභය භූමිය<br>සත්තු<br>අලි<br>මොනරු<br>වැව්<br>ආවේණික සත්තු<br>කුරුල්ලෝ<br>මුවෝ<br>වල් ඌරෝ<br>වලිකුකුළෝ<br>උස ගස්<br>කැලෑව<br>පඳුරු<br>වළවල්<br>වතුර | • අත්දැකීමක් ඇසුරෙන් තොරතුරු සංවිධානාත්මක ව පෙළ ගස්වයි.<br>• අත්දැකීම් ඇසුරින් නිර්මාණාත්මක පාඨ ලියයි.<br>• තම අත්දැකීමක් විස්තරාත්මක ව නිර්මාණාත්මක ව ලියයි. | 03 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 4.3<br>ලිපි ලියයි. | • රාජකාරි ලිපියක්<br>(වරාය නැරඹීමට යාමට අවසර ඉල්ලා සිටීම)<br>தொழில் முறை கடிதம்<br>(துறைமுகத்தை பார்க்கச் செல்வதற் காக அனுமதி கோரல்)<br>ලිඛිත භාෂාව (සරල වාක්‍ය හා අර්ථය ඍජු ව ප්‍රකාශ වීම බලාපොරොත්තු වේ.)<br>වරාය අධිකාරි තුමා.<br>කළමනාකාර තුමා.<br>මහත්මයාණෙනි!<br>අවසරය ලබා ගැනීම.<br>අධ්‍යාපන චාරිකාව<br>බලාපොරොත්තු වෙමු.<br>ස්තුතිවන්ත වෙමු.<br>කරුණාවෙන් ඉල්ලා සිටිමු.<br>වරාය<br>නැරඹීම<br>ශිෂ්‍ය ශිෂ්‍යාවන්<br>ගුරුවරුන්<br>බස් රථය<br>බසයේ අංකය<br>ශ්‍රේණිය<br>දිනය<br>වෙලාව<br>ස්තුති යි.<br>මෙයට<br>විශ්වාසී<br>අත්සන | • රාජකාරි ලිපියක ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• විධිමත් ලිපි ලිවීමට හුරු වෙයි.<br>• රාජකාරි ලිපියක ආකෘතිය අනුගමනය කරමින් ලිපි ලියයි. | 04 |

| ලිවීම | | | | |
|---|---|---|---|---|
| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| | 4.4<br>තොරතුරු සහිත පාඨ ලියයි. | • ආපදා තත්ත්වයක් වාර්තා කිරීම<br>இயற்கை அனர்த்தம் சம்பந்தமாக அறிக்கை சமர்பித்தல்.<br>ගංවතුර<br>නායයාම්<br>සුළිසුළං<br>අකුණු<br>(මෙම තත්ත්වයන් වාර්තා කිරීමට අදාළ වන වචන භාවිතයට ගැනීම) | • අවස්ථාව හඳුනා ගෙන ලියයි.<br>• අවස්ථාවට ගැළපෙන පරිදි කරුණු නිරවුල් ව පෙළ ගස්වයි.<br>• අර්ථය ඍජු ව ප්‍රකාශ වන පරිදි තොරතුරු වාර්තා කරයි. | 03 |
| | 4.5<br>ආකෘති පත්‍ර සම්පූර්ණ කොට ලියයි. | • රැකියා ඉල්ලුම් පත්‍රයක ආකෘතියක්<br>தொழிலொன்றுக்கான மாதிரி விண்ணப்பப் படிவம்<br>තනතුර<br>සම්පූර්ණ නම:<br>මුලකුරු සමග නම:<br>උපන් දිනය:<br>වයස: අවු: මාස:<br>ස්ත්‍රී පුරුෂ භාවය:<br>හැඳුනුම්පත් අංකය:<br>ලිපිනය:<br>විද්‍යුත් තැපැල:<br>අධ්‍යාපන සුදුසුකම්:<br>භාෂා ප්‍රවීණතාව:<br>වෙනත් සුදුසුකම්: | • ආකෘති පත්‍රයක තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කිරීමේ හුරුව ලබයි.<br>• ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කළ යුතු බව පිළිගනියි.<br>• ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කරයි. | 03 |

## දෙවන බස සිංහල 11 ශ්‍රේණිය
## භාෂා අන්තර්ගතය

1.1
- අව්වට, වැස්සට
- ඇතුළු පැත්තට, පිට පැත්තට
- දිය කරමු, එකතු කරමු, බෙදා ගනිමු.
- ඉස්සර, ඒ කාලේ

1.2 ඇවිදින්න / පීනන්න / යන්න } එපා

පැළඳගන්න.
ප්‍රදේශවලට යන්න.
ලබා දෙන්න.

1.3 කොහේ ද?
කීයක් වෙනවද?
වැඩියි නේ ද?

ඉන්නවේවි ද?
ගන්න වේවි ද?

1.4 උදය / දවල් / සවස් / රාත්‍රි } කාලය

කාලයේ ම
දවස ම

- වළකින්න.
- ඉල්ලා සිටිනවා.
- ප්‍රවේශම්වන්න.

1.5

| | | | |
|---|---|---|---|
| බලනවා. | හපනවා. | කැඩෙනවා. | ඇහෙනවා. |
| බැලුවා. | හැපුවා. | කැඩුණා. | ඇහුණා. |
| බලලා. | හපලා. | කැඩිලා. | ඇහිලා. |

2.1 පුළුවන් ද?

අද / සිකුරාදට } බෑ

හමුවන්න පුළුවන්.
අය කරනවා.
ඉන්න වෙනවා.

2.2 පුළුවන් ද?

තියෙනව ද?

ඕනැ ද?

2.3 මොනවා ද?

සහභාගි වුණා ද?

පුළුවන්

බැ

2.4 කවදා ද?

තියෙන්නෙ ?

ලියන්නෙ } මොන භාෂාවෙන් ද?

කතා කරන්නේ }

2.5 කීයක් යනවා ද? එකක්, හතරක්, දහයක්
ගාන්න
කීය ද? දාහයි. දෙදාහයි, පන්දාහයි.

2.6 විදුහල්පතිතුමා

විදහල්පතිවරු අම්මලා

දෙමව්පියෝ

භික්ෂූන් වහන්සේ භික්ෂූන් වහන්සේලා

අමතනවා, අමතයි, අමතති

ආරාධනා කරනවා.

2.7 යන්න ඕනෑ.
ගන්න ඕනෑ.
කරකවන්න ඕනෑ.
බදින්න ඕනෑ.

බිඳුණා.

3.1 ඇතුළුවීමේ දී

පිටවීමේ දී

ලබාගත යුතුයි.

ඇත.

නැත.
ඇතුල්වීම තහනම්

3.2 ඇත, ඇති, ඇති මිනිස්සු,

නැත, නැති, නැති මිනිස්සු

3.3 ගන්නේ ගිණුමෙන් ද?

අවශ්‍ය ද ?

ඔව්/නැත

වැරදි, නිවැරදි

3.4 ශූරතාව

ත්‍රිකුණාමලේට

උතුරු පළාතට

ශ්‍රී ලංකාවට

තද වැසි

4.1 විකිණීමට තියෙනවා/තිබේ.

වවනවා, වවමු, වවන්නෙමු

දිනකට වරක්

දවසකට වරක්

සතියට දෙවරක්

මාසයකට දෙවරක්

4.2 ගියා. ඇත.

දුටුවා. තිබේ.

කරති.

4.3 මහත්මයාණෙනි

විදුහල්පතිතුමණි

මම වෙමි/පතමි.

අපි වෙමු/පතමු.

ස්තුතිවන්ත

සඳහා

4.4 තද වැසි

ඇති වේ.

ලබා දී ඇත.

ඇණ හිට ඇත.

වැටී ඇත.

ඉඩ ඇත.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- සවන්දීම
- කථනය
- කියවීම හා නැරඹීම
- ලිවීම

# සවන් දීම

**නිපුණතාව 0.1 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් ගළපා මැනවින් සැකසූ පාඨවලට (Text) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.1 :** සුහද කතාබහට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**

- සුහද කතාබහට අවධානයෙන් සවන් දී අවස්ථාව ප්‍රකාශ කරයි.
- අලුත් වචන හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- සුහද කතාබස්වලට සවන් දී අවස්ථාවට සුදුසු පරිදි ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පටිගත කරන ලද පාඩමට අදාළ කෙටි සුහද කතාබහක් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- සුහද කතා බහට සවන් දී නිවැරදි ව පිළිතුරු දීමට හොඳින් ඇහුම්කන් දිය යුතු බව පැහැදිලි කරන්න.
- අදාළ පාඩම පළමු ව ගුරුවරයා කියවා ආදර්ශනය කර ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- සවන්දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පාඩම කියවන අතරතුර ශිෂ්‍යයන්ගෙන් වාචික ප්‍රශ්න අසන්න.
- මූලික වදන් යටතේ ඇති වචන හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න.
- එම රටා කීපයක් කළු ලෑල්ලේ ලියා කියවීමට හුරු කරවන්න.
- පාඩමේ ඇතුළත් දෙබස් භාවිත කරමින් එවැනි අවස්ථා පන්තියේ සජීවී ව ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- සියලු ම ශිෂ්‍යයන් ඊට සහභාගී කරවන්න.
- සවන් දී හඳුනා ගත් වචන හා භාෂා රටා දෙබස් කථනයේ දී යොදා ගැනීමට උපදෙස් දෙන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **ප්‍රජා ශාලාව වර්ණාලේප කිරීම**

| | |
|---|---|
| ප්‍රජා ශාලාව | ඉස්සර |
| ගොඩනැගිල්ල | ඒ කාලේ |
| පරණ බිත්ති | |
| තීන්ත | |
| බුරුසු | |
| බාල්දිය | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| ඇතුළු පැත්තට | අව්වට වේලෙනවා. |
| පිට පැත්තට | වැස්සට තෙමෙනවා. |

| | | |
|---|---|---|
| දිය කරනවා. | දිය කරමු. | දිය කරන්න ඕනෑ. |
| එකතු කරනවා. | එකතු කරමු. | එකතු කරන්න ඕනෑ. |
| බෙදා ගන්නවා. | බෙදා ගනිමු. | බෙදා ගන්න ඕනෑ. |

**ගුණාත්මක යෙදවුම් :**

- සුහද කතාබහක් ඇතුළත් ශ්‍රව්‍ය පටයක්
- පෙළ පොතේ පාඩමේ දෙබස් කියවීම සඳහා කලින් සූදානම් කර ගත් ශිෂ්‍යයන් පිරිසක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**
- සවන් දුන් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මූලික වදන්වල ඇති වචන හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් යොදා ගනිමින් අදහස් හුවමාරු කර ගනියි.
- අවස්ථාවට සුදුසු පරිදි කතාබස්වල යෙදෙමින් අදහස් හුවමාරු කර ගනියි.
- නිවැරදි ප්‍රතිචාර දැක්වීම සඳහා අවධානයෙන් සවන් දිය යුතු බව පිළිගනියි.

වචන මාලාව

| | |
|---|---|
| ඉස්සර - **முன்னர்** | ඇතුළු පැත්තට - **உள் பக்கம்** |
| ප්‍රජා ශාලාව - **சனசமூக நிலையம்** | පිට පැත්තට - **வெளிப் பக்கம்** |
| ඒ කාලේ - **அந்த காலத்தில்** | වැස්සට - **மழைக்கு** |
| පරණ බිත්ති - **பழைய சுவர்** | අව්වට - **வெய்யிலுக்கு** |
| තීන්ත - **வர்ணம்** | |
| බුරුසුව - **தூரிகை** | දිය කරමු - **கரைப்போம்** |
| බාල්දිය - **கைவாளி** | එකතු කරමු - **ஒன்று சேர்ப்போம்** |

# සවන් දීම

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.2 :** උපදෙස්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- අවධානයෙන් සවන් දී අවස්ථාව තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රධාන උපදෙස් හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- දෙන ලද උපදෙස්වලට නිවැරදි ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පරිසරය පිරිසිදු ව තබා ගැනීම සඳහා දෙනු ලබන උපදෙස් ඇතුළත් පෝස්ටරයක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇතුළත් වී ඇති පාඩම ශිෂ්‍යයන් ඉදිරියේ ශබ්ද නගා කියවමින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- පාඩමට අදාළ ව සංවාදමය අවස්ථාවක් ඇතුළත් හඬ පටයකට සවන් දීමට අවස්ථාව සලස්වන්න.
- ශිෂ්‍යයන්ට පාඩම කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- මූලික වදන් යටතේ ඇතුළත් වචන කෙරෙහි වැඩි අවධානයක් යොමු කරවන්න.
- පාඩමේ ඇතළත් උපදෙස් ඉස්මතු කරන්න.
- සවන් දීමෙන් හඳුනා ගත් උපදෙස් පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් හැකිතාක් යොදා ගැනීමට යොමු කරන්න.
- ඒ ඒ අවස්ථාවලට අනුව ලැබෙන උපදෙස් පිළිපැදිය යුතු බව ශිෂ්‍යන්ට තහවුරු කරවන්න.
- එම උපදෙස් ඇතුළත් පත්‍රිකාවක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **ගංවතුර අවස්ථාවක ජීවිත බේරා ගැනීමට දෙන උපදෙස්**

  බෝට්ටුව
  ආරක්ෂක කබා
  ගංවතුර
  නාවික හමුදාව
  පොලීසිය
  ගෙවල්

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

  පීනන්න එපා.
  ගංවතුරේ ඇවිදින්න එපා.
  විනෝද වෙන්න යන්න එපා.
  කලබල වෙන්න එපා.
  එළියට අත දමන්න එපා.

  ආරක්ෂිත කබා පැළඳ ගන්න.
  ආරක්ෂිත ප්‍රදේශවලට යන්න.
  අසරණ අයට උදවු කරන්න.
  පිසූ ආහාර ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම් :**

- ගංවතුර අවස්ථාවක් පිළිබිඹු වන පින්තූරයක්
- පාඩමට අදාළ ව සකසා ගත් සංවාද අවස්ථාවක් ඇතුළත් හඬ පටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- පාඩමේ උපදෙස්වලින් පළ කෙරෙන අදහස් කියයි.
- උපදෙස් අවධානයෙන් සවන් දිය යුතු බව පිළිගනියි.
- උපදෙස් අනුව කටයුතු කරයි.

**වචන මාලාව**

**ගංවතුර - வெள்ளம்**

**බෝට්ටුව - படகு**

**ගෙවල් - வீடுகள்**

**පැළඳගන්න - அணியுங்கள்**

**නාවික හමුදාව - கடற்படை**

**ආරක්ෂක කබා - பாதுகாப்புக் கவசம்**

**පොලීසිය - பொலிஸ்**

**උදව් කරනවා - உதவுகிறார்**

# සවන් දීම

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් j y r l ks au ek úk a. <md i el i QmdGj , g ^Text) සවන් දෙමින්, ප්‍රතිචාර දක්වමින්, හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.3 :** මග විමසීම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**

- මග විමසීම්වලට අවධානයෙන් සවන් දී තොරතුරු ඉදිරිපත් කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදාළ වචන භාවිත කරමින් මග විමසීම් කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පාඩමට අදාළ ව සකසා ගත් මග තොරතුරු විමසීමක් හා ඒවාට පිළිතුරු සැපයීමක් ඇතුළත් කෙටි හඬ පටයකට සවන් දීමට සලස්වන්න.
- ඊට අදාළ ව වාචික ප්‍රශ්න අසමින් ශිෂ්‍යයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර ඇගයීමට ලක් කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ පෙළපොතේ පාඩම කියවමින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- මග විමසීම්වලට අවධානයෙන් සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- කෞතුකාගාරයට යන මාර්ග විස්තරය පිළිඳ ප්‍රශ්න අසමින් විමසීමට ශිෂ්‍යයින් යොමු කරවන්න.
- ශිෂ්‍යයන් ලවා තමන් ඇසූ තොරතුරු අනුව කෞතුකාගාරය පිළිබඳ පැවසීමට අවස්ථාව දෙන්න. (සියලු ම ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.)
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **කෞතුකාගාරය නැරඹීමට විස්තර තොරතුරු විමසීම.**

| | |
|---|---|
| බුද්ධ ප්‍රතිමා | කෝ ? |
| දේව ප්‍රතිමා | කොහේ ද? |
| පැරණි කාසි | කීයක් වෙයි ද? |
| ප්‍රවේශ පත්‍ර | වැඩියි නේ ද ? |
| | යන්න වේවි ද? |
| | අය කරන්නේ නෑ |
| | කීයට විතර ද? |

- පුහුණුව සඳහා යොදා ගන්න.

යන්නේ කොහේ ද?

ඉන්නේ කොහේ ද?

බලන්නේ කොහේ ද?

වතුර වැඩියි නේ ද?

සීනි වැඩියි නේ ද?

කහට වැඩියි නේ ද?

ලුණු වැඩියි නේ ද?

ටිකට් එකක් කීයක් වෙනවා ද?

පත්තරයක් කීයක් වෙනවා ද?

පොතක් කීයක් වෙනවා ද?

කොපමණ වෙලා ඉන්න වේවි ද?

කොච්චර වෙලා ඉන්න වේවි ද?

කොපමණ විතර ගන්න වේවි ද?

කොච්චර විතර ගන්න වේවි ද?

**ගුණාත්මක යෙදවුම් :**

- මග විමසීමට අදාළ සකසා ගත් හඬ පටයක්
- සත්තු වත්තක සතුන්ගේ පින්තූර කිහිපයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- අවධානයෙන් සවන් දී මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වන වචන යොදා ගනිමින් ප්‍රතිචාර දක්වයි.
- මග විමසීම්වලට අවධානයෙන් සවන් දිය යුතු බව පිළිගනියි.

**වචන මාලාව**

| | |
|---|---|
| බුද්ධ ප්‍රතිමා | කෝ ? |
| දේව ප්‍රතිමා | කොහේ ද? - எங்கே ? |
| පැරණි කාසි | කීයක් වෙයි ද? - எவ்வளவாகும்? |
| ප්‍රවේශ පත්‍ර - அனுமதிப்பத்திரம் | වැඩියි නේ ද ? - அதிகம் தானே? |
| | යන්න වේවි ද? - போகவேண்டிவருமா? |
| | අය කරන්නේ නෑ |
| | කීයට විතර ද? |
| | කී දෙනෙක් විතර ද? |

# සවන් දීම

**නිපුණතාව 1.0 :** එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.4 :** නිවේදනවලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- අවධානයෙන් සවන් දී නිවේදනයෙන් කියවෙන පණිවිඩය ප්‍රකාශ කරයි.
- නිවේදනයෙන් ග්‍රහණය කර ගත් අලුත් වචන ඉදිරිපත් කරයි.
- නිවේදනයක තිබෙන මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- නිවේදනය තේරුම් ගෙන ප්‍රතිචාර දක්වයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පාඩමට අදාළ ව සකසා ගත් නිවේදනයක් ඇතුළත් හඬ පටයකට ශිෂ්‍යයන්ට සවන් දීමට අවස්ථාව සලස්වන්න.
- ශිෂ්‍යයන්ගේ සවන් දීමේ හැකියාව විමසීම සඳහා එම හඬ පටයට අදාළ ව වාචික ප්‍රශ්න අසන්න.
- ශිෂ්‍යයන්ට සවන් දීමට අවස්ථාව සලස්වන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සැලසුම් කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- අවධානයෙන් සවන් දී ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා වාචික ප්‍රශ්න කිහිපයක් අහන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **කාල ගුණ නිවේදනයක්**

| | |
|---|---|
| කාල ගුණය | ධීවර ජනතාව |
| අකුණු | බටහිර මුහුද |
| තද සුළං | |
| ගං වතුර | |
| වලාකුළු | |
| දිශාව | |
| දිවයින | |

* **පුහුණුව සඳහා යොදා ගන්න.**

උදය කාලය
දවල් කාලය
සවස් කාලය
රාත්‍රි කාලය

දවස ම
දවල් කාලයේ ම
රාත්‍රි කාලයේ ම

පීනන්න යාමෙන් වළකින්න.
නාන්න යාමෙන් වළකින්න.
ජලයට බැසීමෙන් වළකින්න.

ළමයින්ගෙන් ඉල්ලා සිටිනවා.
වැඩිහිටියන්ගෙන් ඉල්ලා සිටිනවා.
මහජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

අකුණුවලින් ප්‍රවේශම් වන්න.
ගං වතුරෙන් ප්‍රවේශම් වන්න.
ළමයින් වතුරට බැසීමෙන් ප්‍රවේශම් වන්න.

**ගුණාත්මක යෙදවුම් :**

* කාලගුණ නිවේදනයක් ඇතුළත් හඬ පටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**
* අසන ලද නිවේදනය හඳුනා ගෙන පැහැදිලි කරයි.
* නිවේදනයට අනුව ප්‍රතිචාර දක්වයි.
* නිවේදනවලට අවධානයෙන් සවන්දිය යුතු බව පිළිගනියි.
* නිවේදනයකට සවන් දී ඒ අනුව කටයුතු කරයි.

**වචන මාලාව**

කාලගුණ දෙපාර්තමේන්තුව - வானிலைத் திணைக்களம்
කාල ගුණය - காலநிலை
දිශාව - திசை
වලාකුළු - மேகம்
ධීවර ජනතාව - மீனவ மக்கள்
බටහිර මුහුද - மேற்குக்கடல்
තද සුළං - அதிகக் காற்று
ගංවතුර - வெள்ளப்பெருக்கு
දිවයින - தீவு

# සවන් දීම

**නිපුණතාව** 1.0 : එදිනෙදා පොදු අවස්ථා හා සිදුවිය හැකි අවස්ථා පිළිබඳ සමීප බස් වහරකින් මැනවින් ගළපා සැකසූ පාඨවලට (Text) සවන් දෙමින් ප්‍රතිචාර දක්වමින් හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 1.5** : ගුවන් විදුලි ප්‍රචාර හා පටිගත කිරීම්වලට සවන් දෙයි. ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** : 04 යි.

**ඉගෙනුම් පල** :

- කතන්දරයට අවධානයෙන් සවන් දී කතාව කෙටියෙන් කියයි.
- කතන්දරයේ ඇතුළත් රසවත් සිද්ධි හා අවස්ථා ඉස්මතු කර දක්වයි.
- කතන්දරයේ අවස්ථා හා සිද්ධි සිහිගන්වමින් රස විඳියි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- ළමා කතන්දරයක් ඇතුළත් හඬ පටයකට ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- කතන්දරයට අදාළ ව වාචික ප්‍රශ්න අසමින් සවන් දීම අගය කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළ පොතේ පාඩම ශබ්ද නගා කියවමින් ශිෂ්‍යයන්ට අවධානයෙන් සවන් දීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ගේ සවන් දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා පාඩම කිය වන අතරතුර වාචික ප්‍රශ්න අසන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- ශිෂ්‍යයන්ට පන්ති කාමරයේ හෝ එළිමහනේ රවුමට ඉන්නට සලස්වා ඔවුන් ඇසූ කතා පුවත, වැල් කතාවක් ලෙසින් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
(එක් ශිෂ්‍යයෙකු එක් වාක්‍යයක් බැගින් පැවසීම.)
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **ළමා කතන්දරයක් (බෙරය හා හිවලා - පංච තන්ත්‍රය)**

| | |
|---|---|
| හිවලා | බැලුවා. |
| බෙරය | කැඩුණා. |
| වනාන්තරය | ඇහුණා. |
| ආහාර | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | | |
|---|---|---|
| බලනවා. | බැලුවා. | බලලා. |
| හපනවා. | හැපුවා. | හපලා. |
| හොයනවා. | හෙව්වා. | හොයලා. |
| කැඩෙනවා. | කැඩුණා. | කැඩිලා. |
| ඇහෙනවා. | ඇහුණා. | ඇහිලා. |

හිවලා — බලනවා. / බැලුවා. / බලලා

පඳුරක් / සිදුරක් } අස්සේ

කමල් — බලනවා. / බැලුවා. / බලලා

හිවලා / බල්ලා / පූසා } හපනවා.

**ගුණාත්මක යෙදවුම් :**

- කතන්දරය ඇතුළත් හඬ පටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- කතන්දරයෙන් කියැවෙන සිද්ධිය හඳුනා ගෙන කියයි.
- කතන්දරය අනුපිළිවෙළින් කියයි.
- කතන්දරයේ රසවත් සිද්ධි හා අවස්ථා මතු කර දක්වයි.
- කතන්දරවලට අවධානයෙන් සවන්දිය යුතු බව පිළිගනියි.

**වචන මාලාව**

හිවලා - நரி

බෙරය - பறை

වනාන්තරය - வனம்

පඳුරක් - செடியொன்று

පඳුරක් අස්සේ - செடிக்குள்ளே

ආහාර - உணவு

සිදුරක් - துளையொன்று

බැලුවා - பார்த்தேன்

හෙව්වා - அடித்தேன்

හැපුවා - வெட்டினேன்

කැඩුණා - உடைத்தேன்

දැනුණා - உணர்ந்தேன்

**නිපුණතාව 2.0:** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.1:** උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**

- උපදෙස් සහිත වාක්‍ය හඳුනා ගෙන කියයි.
- උපදෙස්වලට ප්‍රතිචාර දැක්වීමේ දී ප්‍රශ්න අසමින් ඒවාට මැදිහත් වී කටයුතු කරයි.
- උපදෙස්වලට ප්‍රතිචාර දක්වමින් තම අවශ්‍යතා ඉටුකර ගනියි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පාඩමට අදාළ දෙබස් ඇතුළත් හඬ පටයකට ශිෂයන්ට සවන් දීමට සලස්වන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම ශබ්ද නගා කියවමින් ශිෂ්‍යයන්ට සවන් දීමට සලස්වන්න.
- ශිෂ්‍යයන්ට පාඩම කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- **මූලික වදන් හා පුහුණුව** සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ වැඩි අවධානයක් යොමු කරවන්න.
- පාඩමේ ඇතුළත් සිද්ධියට අදාළව සජීව ඉදිරිපත් කිරීමකට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමේ ඇති ක්‍රියාකාරකම්වලට ශිෂ්‍යයන් යොමු කරවන්න.

**මූලික වදන් :**

- **චැනල් සේවාව මගින් ලැබෙන උපදෙස් :**

| | |
|---|---|
| චැනල් සේවාව | නොම්බරයක් වෙන් කරන්න. |
| වෛද්‍යවරයා | ගෙවන්න. |
| රෝහල | දැන ගන්න. |
| රෝගියා | හමුවන්න පුළුවන්. |
| මුදල් | අය කරනවා. |
| | කීය ද? |
| | කීයට ද? |
| | පුළුවන් ද? |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

අද බෑ.
සිකුරාදා බෑ.
සෙනසුරාදා බෑ.

දෙදාහක් අය කරනවා.
බෙහෙත්වලට අය කරනවා.

මට දැන ගන්න පුළුවන් ද?
අපට දැන ගන්න පුළුවන් ද?
වෙන් කර ගන්න පුළුවන් ද?

මුදල් බඳින්න පුළුවන්.
ඩොක්ටර් හමුවන්න පුළුවන්.
ඩොක්ටර් චැනල් කරන්න පුළුවන්.
බෙහෙත්වලට අය කරනවා.

පෝලිමේ ඉන්න වෙනවා.
ඩොක්ටර් එනතුරු ඉන්න වෙනවා.
බෙහෙත් විදින තුරු ඉන්න වෙනවා.

**ගුණාත්මක යෙදවුම්:**

- පාඩමට අදාළ උපදෙස් සහිත හඬ පටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**
- උපදෙස්වල දී  භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- උපදෙස්වලට අනුව කටයුතු කරමින් වාචික ප්‍රතිචාර දක්වයි.
- උපදෙස්වලට අනුව කටයුතු කිරීමට කැමැත්තෙන් ඉදිරිපත් වෙයි.

**වචන මාලාව**

රෝගියා - நோயாளி

බෙහෙත් - மருந்து

රෝහල - வைத்தியசாலை

වෛද්‍යවරයා - வைத்தியர்

චැනල් සේවාව - செனல் சேவை

මුදල් - பணம்

බැංකුව - வங்கி

පුළුවන් ද? - முடியுமா ?

නොම්බරයක් වෙන් කරන්න - நம்பர் ஒன்று ஒதுக்குங்கள்

ගෙවන්න - செலுத்துங்கள்

දැනගන්න - தெரிந்துக்கொள்ளுங்கள்

හමුවන්න - சந்தியுங்கள்

අයකරනවා - அறவிடுறாங்கள்

කීය ද? - எவ்வளவு ?

කීයට ද? - எவ்ளவுக்கு ?

**නිපුණතාව 2.0:** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.2:** මග විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**

- මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අදාළ වචන භාවිත කරමින් මග විමසීම් සිදු කිරීමට මැදිහත් වෙයි.
- තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා මග විමසීම් කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- චාරිකාවක් යාම සඳහා තොරතුරු විමසීමක් කරන්න.
- මග තොරතුරු නිවැරදි ව ප්‍රකාශ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන සාකච්ඡා කරන්න.
  - මාර්ගය හා ස්ථානය නිවැරදි ව සොයා ගැනීමට හැකිවීම.
  - මග වැරදීමෙන් ඇති විය හැකි අපහසුතාවලින් වැළකීම.
  - කාලය ඉතිරි වීම.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළ පොතේ ඇති පාඩම පරිශීලනය කරන්න.
- ශිෂ්‍යයන්ට පාඩම කියවීමට අවස්ථා ලබා දෙන්න.
- පාඩමේ ඇති විමසීම් තොරතුරු ඉස්මතු කරවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි විශේෂ අවධාය යොමු කරන්න.
- මග විමසීම්වලට අදාළ දෙබස් කථන වශයෙන් හා ශිෂ්‍යයන් ලවා ඉදිරිපත් කරමින් හුරු කරවන්න.
- ශිෂ්‍යයින් දෙදෙනා බැගින් යොදා ගනිමින් ප්‍රශ්න අසමින් මග වීමසීම් කිරීම හා ඒවාට අදාළ පිළිතුරු ලබා දීමට හුරු කරවන්න.
- පාඩමට අදාළ අභ්‍යාස හා ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **හම්බන්තොට වරාය නැරඹීමට යාම.**

| | |
|---|---|
| ප්‍රවේශ පත්‍ර | |
| ආහාර පාන | ඕනෑ |
| හම්බන්තොට වරාය | එපා |
| ජැටිය | පුළුවන් |
| බඩු නැව් | |

බඩු නැව්

ගබඩා සංකීර්ණ

තෙල් ටැංකි

අවට පරිසරය

හෝටල් නේවාසික (නවාතැන්) පහසුකම්

නවතින්න පුළුවන්

ගිහින් තියෙනවා ද?

පහසුකම් තියෙනවා ද?

හුගක් ගෙවන්න ඕනෑ ද?

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

| | |
|---|---|
| නවතින්න | පුළුවන් ද? |
| නාන්න | පුළුවන් ද? |
| උයා ගන්න | පුළුවන් ද? |
| | |
| කැන්ටිමක් | තියෙනවා ද? |
| කාමර කීයක් | තියෙනවා ද? |
| කුස්සියක් | තියෙනවා ද? |

ප්‍රවේශ පත්‍ර ගන්න ඕනෑ ද?
කාමරවලට ගෙවන්න ඕනෑ ද?
කුස්සියට ගෙවන්න ඕනෑ ද?
උයනවට ගෙවන්න ඕනෑ ද?

**ගුණාත්මක යෙදවුම් :**

- මග විමසීම් ඇතුළත් හඬ පටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- මග විමසීම් අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- චාරිකාවල දී විමසීම් කළ යුතු දෑ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- මග විමසීම්වලට මැදිහත් වෙමින් ප්‍රතිචාර දක්වයි.
- තොරතුරු ලබා ගැනීම සඳහා මග විමසීම් කළ යුතු බව පිළිගනියි.

වචන මාලාව

| | |
|---|---|
| හම්බන්තොට වරාය - அம்பாந்தோட்டை துறைமுகம் | තෙල් ටැංකි - எண்ணெய் தாங்கி |
| | අවට පරිසරය - சுற்றுச் சூழல் |
| ජැටිය - இறங்கு துறை | ප්‍රවේශ පත්‍ර - அனுமதிப் பத்திரம் |
| බඩු නැව් - சரக்கு கப்பல் | නවාතැන් පහසුකම් - தங்குமிட வசதி |
| ගබඩා සංකීර්ණය - களஞ்சியத் தொகுதி | ආහාර පාන - உணவு,பானம் |

**නිපුණතාව 2.0 :** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.3 :** සුහද සංවාදවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**

- අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ප්‍රායෝගික අවස්ථාවකට මැදිහත් වෙමින් සංවාදවල යෙදෙයි.
- සුහද සංවාදවල දී ආචාරශීලී ව හා සංයමයෙන් යුතු ව මැදිහත්වෙමින් කටයුතු කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- මේසයක් වටා වාඩි වූ කිහිප දෙනෙකු සාකච්ඡා කරන පින්තූරයක් පෙන්වන්න.
- සම්මුඛ පරීක්ෂණයක දී කිහිප දෙනෙකු ඉදිරියේ පෙනී සිටීමට සිදු වන බව පැහැදිලි කරන්න.
- එවැනි අවස්ථාවක දී ඔවුන්ගේ ප්‍රශ්නවලට ඉවසීමෙන් හා කලබල වීමෙන් තොර ව පිළිතුරු දිය යුතු බව පෙන්වා දෙන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම ශිෂ්‍යයන් ඉදිරියේ ශබ්ද නගා කියවන්න.
- පාඩමේ ඇතුළත් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවක් පන්ති කාමරයේ නිරූපණය කරන්න.
- සියලු ම ශිෂ්‍යයන්ට සහභාගිවීමට අවස්ථාව ලබා දෙන්න.
- **මූලික වදන් හා පුහුණුව** සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරන්න.
- එම වචන අභ්‍යාස පොත්වල ලියා ගැනීමට සලස්වන්න.
- පෙළ පොතේ ඇතුළත් පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

මූලික වදන් :

- **සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීම.**

| | |
|---|---|
| පාඨමාලාව | ආශාව |
| ප්‍රයෝජන | උදවුව |
| යහළුවා | ඉගෙනීම |
| රැකියාව | |
| පන්තිය | |
| ටිකක් | |
| ගොඩක් | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

අධ්‍යාපන සුදුසුකම් මොනවා ද?
බාහිර ක්‍රියාකාරකම් මොනවා ද?

භාෂා තරගවලට සහභාගි වුණා ද?
පළාත් තරගවලට සහභාගි වුණා ද?
ජාතික මට්ටමේ තරගවලට සහභාගි වුණා ද?

මට සිංහල කතා කරන්න පුළුවන්.
මට දෙමළ කතා කරන්න පුළුවන්.
මට ඉංග්‍රීසි කතා කරන්න. පුළුවන්.

මට සිංහල ලියන්න පුළුවන්.
මට දෙමළ ලියන්න පුළුවන්.
මට ඉංග්‍රීසි ලියන්න පුළුවන්.

මට සිංහල කතා කරන්න බෑ.
මට දෙමළ කතා කරන්න බෑ.
මට ඉංග්‍රීසි කතා කරන්න බෑ.

**ගුණාත්මක යෙදවුම්:**

- සම්මුඛ පරීක්ෂණ අවස්ථාවක් නිරූපිත පින්තූරයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සංවාද අවස්ථාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- සුහද සංවාදවලට සහභාගී වී අදහස් හුවමාරු කර ගත යුතු බව පිළිගනියි.
- සංවාදවල දී ආචාරශීලී ව අදහස් හුවමාරු කර ගනියි.
- විමසන කරුණුවලට අදාළ ව ප්‍රතිචාර දක්වයි.

**වචන මාලාව**

පාඨමාලාව - கற்கைநெறி

ඉගෙනීම - கற்றல்

පන්තිය - வகுப்பு

ගොඩක් - அதிகம்

උදව්ව - உதவி

ප්‍රයෝජනය - பயன்பாடு

රැකියාව - தொழில்

ටිකක් - கொஞ்சம்

ආශාව - ஆசை

**නිපුණතාව 2.0:** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.4:** තොරතුරු හුවමාරු කර ගැනීමේ දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල** :

- තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ප්‍රශ්න අසයි.
- අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා ඉදිරිපත් වී කටයුතු කරයි.
- නිරවුල් ව හා පැහැදිලි ව අදහස් හුවමාරු කර ගනියි.
- තොරතුරු හුවමාරු කර ගනිමින් අවශ්‍යතා ඉටු කර ගනියි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- වෘත්තීය පුහුණු පාඨමාලා සහිත අත් පත්‍රිකාවක පින්තූරයක් පෙන්වා ඒ පිළිබඳ ව ප්‍රශ්න අසමින්, එය හඳුනා ගැනීමට සලස්වන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම තෝරා ගන්න.
- ගුරුතුමා/ගුරුතුමී තොරතුරු ලබා දෙන්නා ලෙස ඉදිරිපත් වී ශිෂ්‍යයන් කිහිප දෙනෙකු තොරතුරු විමසන අය ලෙස පත් කර සජීව අවස්ථාවක් ආදර්ශනය කරන්න.
- මේ අවස්ථාවේ දී විමසිය හැකි ප්‍රශ්න පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.
- අසන ප්‍රශ්න නිරවුල් ව පැහැදිලි ව ඉදිරිපත් කළ යුතු බව පෙන්වා දෙන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරවන්න.
- ශිෂ්‍යයින්ගේ කථන කුසලතා වර්ධනය සඳහා මෙම අවස්ථාව නිරූපණය කිරීමට උපදෙස් ලබා දෙන්න.
- සෑම ශිෂ්‍යයෙකුට ම සහභාගිවීමට අවස්ථාව දෙන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි නිරත කරවන්න.

**මූලික වදන් :**

- **වෘත්තීය පුහුණු පාඨමාලාවක් පිළිබඳ තොරතුරු විමසීමක්.**

| | |
|---|---|
| තොරතුරු | කියන්න පුළුවන් ද? |
| රැකියාව | කතා කරන්න පුළුවන් |
| සුදුසුකම් | තියෙනවා ද? |
| ගාස්තුව | කාලයක් තියෙනවා ද? |
| යොමු කරනවා | මොන දවස්වලට ද? |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

1. තියෙන්නේ කවදා ද?
   පවත්වන්නේ කවදා ද?
   පටන් ගන්නේ කවදා ද?
   සම්මුඛ පරීක්ෂණය කවදා ද?

2. මොන පාරේ ද තියෙන්නෙ ?
   මොන දවස්වල ද තියෙන්නෙ ?
   මොන වෙලාවේ ද තියෙන්නේ ?
   මොන භාෂාවෙන් ද තියෙන්නේ ?

3. මම ලියන්නේ සිංහල භාෂාවෙන්
   මම ලියන්නේ දෙමළ භාෂාවෙන්
   මම ලියන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්

4. ඔයා කතා කරන්නේ මොන භාෂාවෙන් ද?
   ඔයා ලියන්නේ මොන භාෂාවෙන් ද?
   ඔයා අයදුම්පත පුරවන්නේ මොන භාෂාවෙන් ද?

**ගුණාත්මක යෙදවුම් :**

- වෘත්තීය පුහුණු පාඨමාලා අත්පත්‍රිකා කිහිපයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- අවස්ථාවට අදාළ ව තොරතුරු හුවමාරු කර ගැනීමට ඉදිරිපත් වෙයි.
- පාඨමාලාවක් හැදෑරීමේ දී විමසිය යුතු තොරතුරු හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- තොරතුරු හුවමාරු කර ගැනීමේ දී ප්‍රශ්න අසමින් මැදිහත් වෙයි.
- තොරතුරු නිරවුල් ව හුවමාරු කර ගත යුතු බව පිළිගනියි.

**වචන මාලාව**

| | |
|---|---|
| තොරතුරු - தகவல் | කතා කරන්න පුළුවන් - கதைக்க முடியுமா ? |
| සුදුසුකම් - தகைமை | කියන්න පුළුවන් - சொல்ல முடியும் |
| ගාස්තුව - கட்டணம் | කාලයක් තියෙනවා - காலம் இருக்கிறது |
| යොමු කරන්න - அனுப்புங்கள் | මොන දවස්වල ද? - எந்த நாட்களில் ? |

තියෙන්නෙ කවදා ද? - எந்த தினத்தில/நாளில் இருக்கிறது ?

**නිපුණතාව 2.0 :** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.5:** ගනුදෙනුවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- ගනුදෙනුවල දී භාවිත වචන හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- එම වචන භාවිත කරමින් ගනුදෙනුවලට මැදිහත් වී කටයුතු කරයි.
- විවිධ ගනුදෙනුවලට සහභාගි වෙමින් කටයුතු කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පුවත්පතක පළ වී ඇති තීන්ත වෙළඳසැලක පින්තූරයක් ශිෂ්‍යයන්ට ප්‍රදර්ශනය කරන්න.
- එදිනෙදා ජීවිතයේ දී වෙළෙඳ සැලකින් භාණ්ඩ මිලදී ගැනීමට (ගනුදෙනු කිරීමට) සිදු වන බව පැහැදිලි කරන්න.
- නිපුණතා මට්ටමකට අදාළ ව පෙළ පොතේ ඇති පාඩම ශිෂ්‍යයන් ඉදිරියේ කියවන්න.
- මෙවැනි ගනුදෙනුවක දී භාවිත වචන කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- ඒවා ශිෂ්‍යයන් ලවා කණ්ඩායම් වශයෙන් හා තනි තනි ව උච්චාරණය කරවන්න.
- මූලික වදන් යටතේ ඇති වචන හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- තීන්ත මිලදී ගැනීමේ අවස්ථාව පන්ති කාමරයේ භූමිකා රංගනයක් මගින් ශිෂ්‍යයන් ලවා ඉදිරිපත් කරවන්න.
- පෙළ පොතේ පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **ප්‍රජා ශාලාව වර්ණාලේප කිරීම සඳහා තීන්ත මිල දී ගැනීම.**

| | |
|---|---|
| තද පාට | දිය කරන්න. |
| ලා පාට | ගාන්න. |
| තීන්ත | දිය කරමු. |
| ලීටර් | එකතු කරමු. |
| වර්ග අඩි | බෙදා ගනිමු. |
| ප්‍රජා ශාලාව | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

කීයක් යනවා ද?
රුපියල් කීයක් යනවා ද?
ලීටර් කීයක් යනවා ද?

එළියේ බිත්තිවල ගාන්න.
පිට පැත්තේ බිත්තිවල ගාන්න.
ඇතුල් පැත්තේ බිත්තිවල ගාන්න

ලීටර් එකක් කීය ද?
ලීටර් හතරක් කීය ද?
ලීටර් දහයක් කීය ද?

දාහ යි.
දෙදාහ යි.
පන්දාහ යි.
දහදාහ යි.

මාරු කරන්න පුළුවන් ද?
නැවත ගන්න පුළුවන් ද?

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත් පතක පළ වී ඇති තීන්ත වෙළෙඳ සැලක පින්තූරයක්
- ගනුදෙනුවල දී භාවිත වචන ඇතුළත් පත්‍රිකාවක්
- පෙළ පොත

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- ගනුදෙනු සඳහා ඉදිරිපත් වෙයි.
- ඉගෙනුම් අවස්ථාවට අදාළ ගනුදෙනුවල භාවිත වචන ප්‍රකාශ කරයි.
- ගනුදෙනුවල දී මැදිහත් වී කටයුතු කරයි.

**වචන මාලාව**

| | |
|---|---|
| තද පාට - **கடும் நிறம்** | එකක් කීය ද? - **ஒன்று எவ்வளவு ?** |
| ලා පාට - **இள நிறம்** | දෙකක් කීය ද? - **இரண்டு எவ்வளவு ?** |
| තීන්ත - **வர்ணம்** | දාහයි. - **ஆயிரம்** |
| ප්‍රජා ශාලාව - **சனசமூக நிலையம்** | දෙදහයි. - **இரண்டாயிரம்** |
| වර්ග අඩි - **சதுர அடி** | පන්දාහයි. - **ஐயாயிரம்** |
| ලීටර් - **லீற்றர்** | දස දාහයි. - **பத்தாயிரம்** |

**නිපුණතාව 2.0 :** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.6:** සාකච්ඡාවල දී මැදිහත් වෙයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- උත්සව සංවිධානය කිරීම සඳහා සහභාගි වෙයි.
- සාකච්ඡාවලට මැදිහත් වී අදහස් ඉදිරිපත් කරයි.
- උත්සවයක් සංවිධානය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- සාකච්ඡාවකට අවශ්‍ය පසුබිම සුදුසු පරිදි සකසා ගන්න.
- සාකච්ඡාවක් කිරීමට ශිෂ්‍යයන් සූදානම් කරන්න. ඒ අනුව චරිත තෝරා ගන්න.
- පාඩම කියවන අතර තුර වාචික ප්‍රශ්න අසමින් අදාළ පිළිතුරුදීමේ හැකියාව දියුණු කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම කියවන්න.
- මාතෘකාවට අදාළ ව සියලු දෙනාගේ ම අදහස් අනුව වැඩ සටහන් පිළියෙල කරවන්න.
- පිළියෙල කළ වැඩ සටහන් පන්තියට ඉදිරිපත් කරවන්න.
- ශිෂ්‍යයන්ගේ අදහස් මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
- මූලික වදන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පෙළ පොතේ පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

මූලික වදන් :

- **මත් උවදුර දුරු කිරීමේ පෙරහැරක් සංවිධානය කිරීම**

| | | |
|---|---|---|
| මන්ත්‍රී තුමා | දෙමව්පියෝ | දැනුවත් කරනවා. |
| පූජක තුමා | වෙළඳ ව්‍යාපාරිකයන් | උපදෙස් දෙනවා. |
| | | සංවිධානය කරනවා. |
| විදුහල්පති තුමා | පන්සල | දැන්වීම් පුවරු |
| හාමුදුරුවෝ | පල්ලිය | ප්‍රදර්ශනය කරනවා. |
| | කෝවිල | පෙරහැර |
| | | සංවිධායක කමිටුව |
| | | ප්‍රථමාධාර |
| | | සැරසිලි |
| | | සංග්‍රහ කිරීම් |
| | | පහසුකම් |

- පුහුණුව සඳහා යොදා ගන්න.

මන්ත්‍රී තුමා
ඇමති තුමා
විදුහල්පති තුමා
පොලිස් පරීක්ෂක තුමා
→ සභාව අමතනවා/සභාව අමතයි.

වෙළෙඳ ව්‍යාපාරිකයෝ
දෙමව්පියෝ
නගරවැසියෝ
→ ආධාර කරනවා/ආධාර කරති.

හාමුදුරුවරු
පූජකවරු
ගුරුවරු
ඇමතිවරු
මන්ත්‍රීවරු
→ සභාව අමතනවා/අමතති.

භික්ෂූන් වහන්සේ - භික්ෂූන් වහන්සේලා
ස්වාමීන් වහන්සේ - ස්වාමීන් වහන්සේලා

| | | | |
|---|---|---|---|
| අම්මලා | තාත්තලා | රාලහාමිලා | මන්ත්‍රී තුමා - මන්ත්‍රී තුමාලා |
| අයියලා | අක්කලා | දොස්තරලා | ඇමති තුමා - ඇමති තුමාලා |
| නංගිලා | මල්ලිලා | මුදලාලිලා | සභාපති තුමා - සභාපති තුමාලා |

**ගුණාත්මක යෙදවුම් :**

- කණ්ඩායම් සාකච්ඡාවක් ඇතුළත් පින්තූරයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- සාකච්ඡාවලට කැමැත්තෙන් ඉදිරිපත් වෙයි.
- සාකච්ඡාවලට මැදිහත් වී අවස්ථානුකූල ව අදහස් ඉදිරිපත් කරයි.
- සංවිධාන හැකියාව ප්‍රදර්ශනය කරයි.
- උත්සව සංවිධානය කිරීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

වචන මාලාව

මන්ත්‍රී තුමා - பாராளுமன்ற உறுப்பினர் அவர்கள்
හාමුදුරුවරු - பிக்குமார்கள்
පූජක තුමා - பூசகர் அவர்கள்
පූජකවරු - பூசகர்கள்
මව්ලවි තුමා - மௌவி அவர்கள்
ගුරුවරු - ஆசிரியர்கள்
දැනුවත් කරනවා - அறிவுறுத்துகிறோம்
ඇමතිවරු - அமைச்சர்கள்
ප්‍රදර්ශනය කරනවා - காட்சிப்படுததுகிறோம்
දෙමව්පියෝ - பெற்றார்கள்
සංවිධාන කරනවා - ஒழுங்குப்படுத்துகிறோம்
උපදෙස් දෙනවා - ஆலோசனை வழங்குகிறோம்

පන්සල - பன்சாலை
පල්ලිය - பள்ளி
කෝවිල - கோவில்
දැන්වීම් පුවරු - அறிவித்தல் பலகை

**නිපුණතාව 2.0 :** පොදු මෙන් ම සිදුවිය හැකි හා කාල්පනික විවිධ මාතෘකා යටතේ කෙරෙන කතාබස්වලට මැදිහත් වෙමින් ඒවාට ප්‍රතිචාර දක්වමින් සහභාගී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 2.7:** කෙටි සරල වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද** : 03 යි.

**ඉගෙනුම් පල :**

- ඉදිරිපත් කිරීමට සූදානම් වන අවස්ථා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- අවස්ථාවට ගැළපෙන පරිදි කරුණු සංවිධානය කරයි.
- උචිත වචන භාවිත කරමින් වාචික ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- සිංහල අලුත් අවුරුදු උත්සවයකට අදාළ පිංතූරයක් පෙන්වා ප්‍රශ්න අසමින් එය හඳුනා ගැනීමට සලස්වන්න.
- සිංහල අලුත් අවුරුදු උත්සවය පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- අවුරුදු උත්සවවල ඇතුළත් වන අංග පිළිබඳ සාකච්ඡා කරන්න.
- අවුරුදු උත්සවයක නිවේදන කාර්යය ගැන පැහැදිලි කරන්න (නිවේදන ඇතුළත් හඬ පටයක් උදව් කරගත හැකි ය.)
- නිවේදකයකු ලෙස අලුත් අවුරුදු උත්සවයේ ක්‍රීඩා පිළිබඳ විස්තර කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- සෑම ශිෂ්‍යයෙකුට ම අවස්ථාව දෙන්න
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **අලුත් අවුරුදු උත්සවයක ක්‍රීඩා පිළිබඳ සජීව විස්තර කථනයක්**

කණා මුට්ටිය
රෙදි කැල්ල
මුට්ටිය
එල්ලනවා.
පෝලිමක් හැදෙනවා.
ඇස් බඳිනවා.
රවුම් තුනක් කරකවනවා.
පොල්ලක් දෙනවා.
ගැහැනු
පිරිමි
තරගකරුවන්
තරග කොන්දේසි
පුවක් ගහක්
කොඩිය
ග්‍රීස් ගානවා.
හිටවනවා.
ගන්නවා.
ලිස්සනවා.
මුදුනට නගිනවා.
ඇඟේ ගෑවෙනවා.
පිහ දානවා.
සහභාගි වෙන්න.
විවෘත තරගයක්
දිනනවා.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

සහභාගි වෙන්න පුළුවන්.
ඉදිරිපත් වෙන්න පුළුවන්.
කණා මුට්ටිය බිඳින්න පුළුවන්.

පෝලිමට යන්න ඕනෑ.
වටයක් කරකවන්න ඕනෑ
නිල් මුට්ටියට ගහන්න ඕනෑ

මුට්ටි තුනක් ලණුවේ ගැට ගහන්න ඕනෑ.
ඇස් දෙක රෙදි පටියකින් බඳින්න ඕනෑ.

සාර්ථක පහරක්
අසාර්ථක පහරක්

වතුර මුට්ටිය බිඳුණා.
හිස් මුට්ටිය බිඳුණා.
නිල් මුට්ටිය බිඳුණා.

**ගුණාත්මක යෙදවුම් ඃ**

- සිංහල අලුත් අවුරුදු උත්සවයකට අදාළ පින්තූරයක්
- අවුරුදු උත්සවයක නිවේදන ඇතුළත් හඬ පටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- විස්තර කථනය සඳහා ඉදිරිපත් වෙයි.
- එම අවස්ථාවන්ට ගැළපෙන පරිදි සුදුසු වචන භාවිත කරයි.
- අවස්ථාවට ගැළපෙන පරිදි විස්තර කථන සිදු කරයි.
- උත්සව අවස්ථාවල දී ඊට ගැළපෙන පරිදි රසවත් ව විස්තර කථන ඉදිරිපත් කළ යුතු බව පිළිගනියි.

වචන මාලාව

තරගකරුවෝ - **போட்டியாளர்கள்**

මුට්ටිය - **முட்டி**

කණා මුට්ටිය - **கண்கட்டி முட்டி**

රෙදි කෑල්ල - **துணித்துண்டு**

ආරම්භ වෙනවා - **ஆரம்பமாகிறது**

පටන් ගන්නවා - **தொடங்குகிறது**

භේදයක් නෑ - **பேதமில்லை**

ගැහැනු - **பெண்**

පිරිමි - **ஆண்**

## කියවීම හා නැරඹීම

**නිපුණතාව 3.0 :** එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වයි. ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.1 :** ලිපි හා වෙනත් ලේඛන කියවයි. නරඹයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- පුවත් පත් වාර්තාවක්/ලිපියක් කියවා එහි අදහස කෙටියෙන් ප්‍රකාශ කරයි.
- පුවත් පත් වාර්තාවක්/පින්තූර බලා තොරතුරු පැහැදිලි කරයි.
- විවිධ ලේඛන අවබෝධයෙන් කියවා තොරතුරු ප්‍රකාශ කරයි. ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය :**

- පෙළපොතේ පාඩමට ගැළපෙන පින්තූරයක් (අධිවේගී මාර්ගයක) පෙන්වා ප්‍රශ්න අසමින් එය හඳුනා ගැනීමට සලස්වන්න.
- අධිවේගී මාර්ගයක තොරතුරු ඇතුළත් පුවත්පත් වාර්තාවක් පෙන්වා එය ශිෂ්‍යයන්ට ඇසෙන සේ ශබ්ද නගා කියවන්න.
- වාර්තාවේ ඇතුළත් කරුණු (අදහස) කෙටියෙන් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න.
- අධිවේගී මාර්ගයක ස්වභාවය විස්තර කර එය අපට ප්‍රයෝජනවත් වන අයුරු පෙන්වා දෙන්න.
- පාඩම ශිෂ්‍යයන්ට කියවීමට අවස්ථාව සලසා දෙන්න.
- පාඩමේ අන්තර්ගතයේ ඇති තොරතුරු පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පෙළ පොතේ පාඩමට අදාළ ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයන් නිරත කරවන්න.

මූලික වදන් :

- යාපනයට අධිවේගී මාර්ගයක්

| | | |
|---|---|---|
| මංතීරු | ප්‍රවේශ පත්‍ර | අවම |
| ගුවන් පාලම | ප්‍රවේශ ස්ථාන | උපරිම |
| උමං | වේග සීමා | අනතුරු |
| මාර්ග සංඥා | | මාර්ග නීති |
| හරස් මාර්ග | | ගාස්තු |
| පදික මාරු | ත්‍රීරෝද | |
| වාහන | මෝටර් සයිකල් | උතුරු පළාත |
| හුවමාරු ස්ථාන | ට්‍රැක්ටර් | ශීඝ්‍ර සංවර්ධනයක් |

- පුහුණුව සඳහා යොදා ගන්න.

ත්‍රී රෝද රථ ඇතුල් වීම තහනම්.

මෝටර් සයිකල් ඇතුල් වීම තහනම්.

ට්‍රැක්ටර් ඇතුල්වීම තහනම්.

ඇතුල් වීමේ දී ප්‍රවේශ පත්‍ර ලබාගත යුතු ය.

පිට වීමේ දී මුදල් ගෙවිය යුතු ය.

අධිවේගී මාර්ගයේ ගුවන් පාලම් ඇත.

අධිවේගී මාර්ගයේ හුවමාරු ස්ථාන ඇත.

අධිවේගී මාර්ගයේ පදික මාරු නැත.

අධිවේගී මාර්ගයේ පදික වේදිකා නැත.

**ගුණාත්මක යෙදවුම් ː**

- අධිවේගී මාර්ගයක් පින්තූර කීපයක්
- අධිවේගී මාර්ගය පිළිබඳ පුවත් පත් වාර්තාවක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් ː**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පින්තූර බලා අධිවේගී මාර්ගය හඳුනා ගෙන අදහස් ප්‍රකාශ කරයි.
- පුවත්පත් වාර්තා/පාඩමේ අන්තර්ගතයේ ඇති තොරතුරු ඉදිරිපත් කරයි.
- පුවත්පත් වාර්තා/ලිපි කියවයි.
- කියවීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

වචන මාලාව

වාහන - வாகனம்
මංතීරු - வீதிக் கோடுகள்
ගුවන් පාලම - மேம்பாலம்
උමං - சுரங்கம்
මාර්ග සංඥා - வீதி சமிக்ஞை
අධිවේගී මාර්ග - அதிவேகப் பாதை
පදික මාරුව - பாதசாரிகள் கடவை
හුවමාරු ස්ථාන - பரிமாற்றும் இடம்
ත්‍රී රෝද - திரிவீல், முச்சக்கரவண்டி
මෝටර් සයිකල් - மோட்டர் சைக்கில்
ට්‍රැක්ටර් - டிரெக்கடர்
ප්‍රවේශ ස්ථාන - நுழைவிடம்
වේග සීමා - வேக எல்லை
ගම්මාන - கிராமம்
වනාන්තර - வனம்

ගාස්තු - கட்டணம்
මාර්ග නීති - வீதி விதிமுறைகள்
වංගු - வளைவு
අනතුරු - விபத்து
අවම - குறைந்த
උපරිම - உயர்/அதிக
උතුරු පළාත - வடமாகாணம்
ශීඝ්‍ර සංවර්ධනයක් - விரைவான அபிவிருத்தி

**නිපුණතාව 3.0 :** එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වයි. ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.2 :** සාහිත්‍යමය පාඨ කියවයි. නරඹයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- ගීතය අනුකරණය කරමින් ගායනා කරයි.
- ගීතයේ සරල අදහස තේරුම් ගෙන ප්‍රකාශ කරයි.
- ගීතය අර්ථාවබෝධයෙන් යුතු ව ගායනා කරමින් රස විඳියි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පාඩමේ ඇතුළත් දේශාභිමානී ගීතයට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න. (හඬ පටයක් මගින්)
- එම ගීතයේ ඇතුළත් තොරතුරු ශිෂ්‍යයින්ගෙන් විමසමින් දේශාභිමානී ගීතයක ලක්ෂණ පැහැදිලි කරන්න.
  - අප රටේ බොහෝ සම්පත් තිබීම.
  - ඒවායින් තමන්ට ආඩම්බරයක් ඇතිවීම.
  - ඒවා ආරක්ෂා කරගැනීම අපේ යුතුකමක් බව.
- නැවත ගීතය අසන්නට සලස්වමින් සියලු ම ශිෂ්‍යයින්ට ගායනා කිරීමට උපදෙස් දෙන්න.
- ගීතයේ ඇතුළත් අදහස් ශිෂ්‍යයින් ලවා ඉදිරිපත් කරවන්න. (සෑම ශිෂ්‍යයෙකුට ම අවස්ථාව ලබා දෙන්න.)
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පෙළ පොතේ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **දේශාභිමානී ගීතයක්**

| | |
|---|---|
| මගේ රට | හැදෙන වැඩෙන |
| මවු රට | ඇති නැති |
| ඉපදුණ රට | එඩිතරකම |
| සරු පස | කම්මැලිකම |
| වැහි බිඳු | සිරිලක |
| මිණි කැට | සුරපුරය |
| මුතු කැට | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

මේ රට මගෙ රට
මා ඉපදුණු රට
හැදෙන වැඩෙන රට
මගේ ම මව් රට

මම ගුරුතුමියට / මවට / ලොවට } කියමි

සරුපස පොළවෙන්
වැහි බිඳු අහසෙන්
මිණි කැට මුතු කැට
ඇත මගෙ සිරිලක

ඇත/නැත ඇති මිනිස්සු
මිණි කැට ඇත. නැති මිනිස්සු
මුතු කැට ඇත.

මගෙ සිරිලක ගැන
ලොවට කියමි මම
සුරපුරයක් වෙන
ලොවේ මෙවැනි නැත

ධනය ඇත. ධනය ඇති මිනිස්සු
ධනය නැත ධනය නැති මිනිස්සු

එඩිතර කම ඇති
කම්මැලි කම නැති
ළමයි සිටින රට
මගෙ මේ සිරිලක

පද රචනය - **මිරැන්ඩා හේමලතා**

**ගුණාත්මක යෙදවුම් :**

- දේශාභිමානී ගීතයක් ඇතුළත් හඬපටයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- හඬ පටයේ අතුළත් ගීතය අනුකරණය කරමින් කණ්ඩායම් වශයෙන් /තනි තනි ව ගායනා කරයි.
- ගීතයේ ඇතුළත් වචනවල අදහස කියයි.
- ගීතයේ සරල අදහස් කෙටියෙන් කියයි.
- දේශාභිමානී ගීත ගැයීමට කැමැත්ත ප්‍රකාශ කරයි.

වචන මාලාව

| | |
|---|---|
| මගේ රට - எனது நாடு | මව් රට - தாய் நாடு |
| ඉපදුණු රට - பிறந்த நாடு | සරුපස - வளமான மண் |
| වැහි බිඳු - மழைத்துளி | මිණි කැට - மாணிக்கம் |
| මුතු කැට - முத்துமணி | හැදෙන වැඩෙන - பிறந்து வளர்ந்த |
| ඇති නැති - இருக்கிற,இல்லாத | එඩිතර කම - துடிதுடிப்பான |
| කම්මැලිකම - சோம்பேறித் தன்மை | සිරිලක - சுபீட்சமான இலங்கை |
| සුරපුරය - தேவலோகம் | |

**නිපුණතා 3.0 :** එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text) අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.3 :** උපදෙස් කියවයි. නරඹයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- සවිස්තර උපදෙස් නිරීක්ෂණය කර කියවයි.
- උපදෙස් අනුව කටයුතු කරයි.
- කාඩ්පත් භාවිතයෙන් එදිනෙදා තම අවශ්‍යතා ඉටුකර ගනියි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- මුදල් ලබා ගැනීමේ ස්වයංක්‍රීය කාඩ්පතක් (ATM කාඩ්) පෙන්වා ප්‍රශ්න අසමින් එය හඳුනා ගැනීමට සලස්වන්න.
- ස්වයංක්‍රීය කාඩ්පතක් මගින් තමාගේ බැංකු ගිණුමේ ඇති මුදල් ලබා ගත හැකි බවත් ඒ සඳහා පිළිපැදිය යුතු ක්‍රියා පිළිවෙල පැහැදිළි කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- එක් එක් ශිෂ්‍යයා ලවා එම උපදෙස් කියවන්න.
- නිපුණතා මට්ටමට ආදළ ව පෙළ පොතේ ඇති පාඩම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.
- පාඩම කොටස් වශයෙන් ශිෂ්‍යයන් ලවා කියවන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

මූලික වදන් :

- **ස්වයංක්‍රීය (ATM) කාඩ්පතක් භාවිතයට උපදෙස් :**

කාඩ්පත

රහස් අංකය

ගිණුම - ජංගම/ඉතිරිකිරීමේ

මුදල

රැඳී සිටින්න.

ඇතුළු කරන්න/සටහන් කරන්න

තෝරා ගන්න/ඉවත් කරන්න/නැවත ලබා ගන්න

වැරදි/නිවැරදි

ගිණුමෙන් ද ?

ඔව්/නැත

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

සල්ලි ගන්නෙ මොන ගිණුමෙන් ද?

සල්ලි ගන්නෙ ජංගම ගිණුමෙන් ද?

සල්ලි ගන්නෙ ඉතිරිකිරීමේ ගිණුමෙන් ද?

ඔබට අවශ්‍ය මුදල

| 500 |
|---|

| 1000 |
|---|

| 2000 |
|---|

| 5000 |
|---|

| වෙනත් |
|---|

රිසිට් පතක් අවශ්‍යද? ඔව්/නැත

ගනුදෙනු දැනුවත් කිරීම අවශ්‍ය ද? ඔව්/නැත

**ගුණාත්මක යෙදවුම් :**

- මුදල් ලබා ගැනීමේ ස්වයංක්‍රීය කාඩ්පතක ආකෘතියක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- උපදෙස්වලින් ප්‍රකාශ වන අදහස් කියයි.
- උපදෙස් අනුව කටයුතු කර තම අවශ්‍යතා ඉටු කර ගනියි.
- උපදෙස් පිළිපැදීමෙන් තම කාර්යයන් ඉක්මනින් හා නිවැරදි ව ඉටු කර ගත හැකි බව පිළිගනියි.

වචන මාලාව

ගිණුම - கணக்கு

ජංගම - நடமாடும்/ நடைமுறை

ඉතිරිකිරීම - சேமிப்பு

කාඩ්පත් - காட் /அட்டை

වැරදි/නිවැරදි - பிழை/சரி

ගිණුමෙන් ද? - கணக்கிலா ?

ඔව්/නැත - ஆம்/இல்லை

රිසිට් පත් - பற்றுச்சீட்டு/சிட்டை

ඇතුළු කරන්න - உட்செலுத்துங்கள்

රහස් අංකය - இரகசிய இலக்கம்

සටහන් කරන්න - குறிப்பிடுங்கள்

තෝරා ගන්න - தெரிவு செய்யுங்கள்

ඉවත්කර ගන්න - ஒதுக்கிக் கொள்ளுங்கள்

නැවත ලබාගන්න - திரும்ப பெற்றுக் கொள்ளுங்கள்

**නිපුණතාව 3.0 :** එදිනෙදා පොදු මෙන් ම සිදුවිය හැකි හා වෙනත් අවස්ථා ගැන සමීප හා නුහුරු කතාබස්වලින් සැකසුණු විවිධ පාඨ (Text අවබෝධයෙන් කියවා ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන තොරතුරු හඳුනා ගනියි. තේරුම් ගනියි.

**නිපුණතා මට්ටම 3.4:** ශ්‍රව්‍ය දෘශ්‍ය පාඨ (**Audio visual text**) හා වෙනත් මාධ්‍ය තොරතුරු කියවයි. නරඹයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- පුවත් පතක ප්‍රධාන පින්තූර බලා සිරස්තල කියවයි.
- සිරස්තලවලට අදාළ තොරතුරු ප්‍රකාශ කරයි.
- විවිධ සිරස්තල කියවයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- පුවත්පතක් පෙන්වා එහි ඇති සිරස්තල ශිෂ්‍යයින්ට ඇසෙන සේ කියවන්න.
- පුවත්පතේ පින්තූර පෙනවා ඒවායින් මතු වන අදහස් ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- සෑම ශිෂ්‍යයෙකුටම පුවත් පතේ පින්තූර නැරඹීමට හා අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම ශිෂ්‍යයින්ට ඇසෙන සේ කියවන්න.
- පාඩම කොටස් වශයෙන් ශිෂ්‍යයින් ලවා කියවන්න.
- පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයින්ගේ අවධානය යොමු කරන්න.
- සිරස්තලයක් බැගින් ලිවීමට ශිෂ්‍යයින්ට උපදෙස් දෙන්න.
- තමා විසින් ලියන ලද සිරස්තලයට අදාළ තොරතුරු ප්‍රකාශ කිරීමට ශිෂ්‍යයින්ට අවස්ථාව ලබා දෙන්න.
- පාඩමට අදාළ අභ්‍යාස ක්‍රියාකාරකම්වල ශිෂ්‍යයින් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **පුවත්පත් සිරස්තල කියවීම.**

| | |
|---|---|
| අගමැති/ජනාධිපති | ප්‍රධාන පිටුවේ ඇති සිරස්තල |
| බස්නාහිර පළාත | විවිධ කාලගුණික තොරතුරු |
| ජනතාව | ක්‍රීඩා තොරතුරු |
| තද වැසි | විදෙස් පුවත් |
| ශූරතාව | |

- පුහුණුව සඳහා යොදා ගන්න.

විස්සයි විස්ස
වොලිබෝල්
ක්‍රිකට්
නෙට්බෝල්

ශූරතාව

ත්‍රිකුණාමලේට
උතුරු පළාතට
මහා විද්‍යාලයට
ශ්‍රී ලංකාවට

බස්නාහිර පළාතට තද වැසි
උතුරු පළාතට තද වැසි
මධ්‍යම පළාතට තද වැසි

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත් පත් සිරස්තල කීපයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- පුවත්පත්වල පින්තූර බලා සිරස්තල කියවයි.
- සිරස්තලවල ඇතුළත් අදහස් කියයි.
- සිරස්තලවලට අදාළ වූ තොරතුරු කියයි.
- විවිධ සිරස්තල කියවීමට ඇති හැකියාව පිළිබඳ සතුටු වෙයි.

වචන මාලාව

ජනාධිපති - ஜனாதிபதி
ත්‍රිකුණාමලේ - திருக்கோணமலை
බස්නාහිර පළාත - கிழக்கு மாகாணம்
මහා විද්‍යාලය - மகா வித்தியாலயம்
ශ්‍රී ලංකා - இலங்கை
ශූරතාව - திறமை

විස්සයි විස්ස - இருபதுக்கு இருபது
වොලිබෝල් - வொலிபோல்/கரப்பந்து
ක්‍රිකට් - கிரிகெட்
නෙට්බෝල් - வலைப்பந்து

## ලිවීම

**නිපුණතාව 4.0 :** පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

**නිපුණතා මට්ටම 4.1 :** විස්තර පාඨ ලියයි.

**කාලච්ඡේද :** 05 යි.

**ඉගෙනුම් පල :**

- මාතෘකාවකට අනුව කරුණු පෙළ ගස්වයි.
- මාතෘකාවට අදාළ ව විස්තර පාඨ ලියයි.
- මාතෘකානුකූල රචනා ලියයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- මාතෘකාවකට අනුව ලියන ලද කෙටි රචනයක් ශිෂ්‍යයින්ට ඇසෙන සේ කියවන්න.
- රචනාවක් ලිවීමේ දී මාතෘකාවට අනුව කරුණු පෙළ ගස්වා ලිවිය යුතු බව පැහැදිලි කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළ පොතේ පාඩම ශිෂ්‍යයින්ට ඇසෙන සේ කියවන්න.
- ශිෂ්‍යයින්ගෙන් ප්‍රශ්න අසමින් එහි ඇති තොරතුරු සාකච්ඡා කරන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයින්ගේ අවධානය යොමු කරවන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයින් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **අපේ ගෙවතු වගාව**

ඇට

පැළ

එළවළු

මෑ

කරවිල

වැටකොළු

වම්බටු

බණ්ඩක්කා

පලතුරු

පේර

ගස්ලබු

උදලු ගානවා.

සුද්ද කරනවා.

කාණු කපනවා.

වළවල් හාරනවා.

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

ගෙදර —— පලතුරු

පාසලේ —— මල් —— විකිණීමට —— තියෙනවා/තිබේ.

ගෙවත්තේ —— එළවළු

දිනකට —— වරක් —— වතුර දාන්න.

සතියට

සතියකට —— දෙවරක් —— පොහොර දාන්න.

මසකට

මාසයකට

අපි වවනවා/වවමු. අපි වත්තේ මල් වවමු.

අපි මල් වවනවා/වවමු. අපි වත්තේ එළවළු වවමු.

අපි පලතුරු වවනවා/වවමු.

අපි එළවළු වවනවා/වවමු.

**ගුණාත්මක යෙදවුම් :**

- මාතෘකාවකට අනුව ලියන ලද කෙටි රචනාවක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- රචනා ලිවීමට සුදුසු මාතෘකා ලියයි.
- රචනාවක් ලිවීමේ දී මාතෘකාවට අනුව කරුණු පෙළ ගැස්විය යුතු බව පවසයි.
- මාතෘකාවට අදාළ කරුණු පෙළ ගස්වා ලිවීමෙන් රචනාව සාර්ථක වන බව පිළිගනියි.
- මාතෘකානුකූල ව රචනා ලියයි.

## වචන මාලාව

| | |
|---|---|
| එළවළු - மரக்கறி | පේර - கொய்யா |
| පලතුරු - பழவகைகள் | අඹ - மாங்காய் |
| මල්පැල - பூக்கன்று | ගස්ලබු - பப்பாசி |
| ඇට - விதை | වවනවා - நடுகிறேன்/வளர்க்கிறேன்/ செய்கிறேன் |
| පැළ - கன்று | උදලු ගානවා - உதவி செய்கிறேன் |
| කරවිල - பாகற்காய் | සුද්ද කරනවා - சுத்தம் செய்கிறேன் |
| වැටකොළු - பீர்கங்காய் | කානු කපනවා - கான் வெட்டுகிறேன் |
| වම්බටු - கத்தரிக்காய் | වළවල් හාරනවා - குழிகள் வெட்டுகிறேன் |
| බණ්ඩක්කා - வெண்டிக்காய் | දිනකට - நாளொன்றுக்கு |
| පොහොර - உரம் | සතියට - வாரத்துக்கு |
| මාසයට - மாசத்துக்கு/மாதத்திற்கு | මාසයකට - மாதமொன்றுக்கு |

| | | |
|---|---|---|
| **නිපුණතාව 4.0** | **:** | පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි. |
| **නිපුණතා මට්ටම 4.2** | **:** | නිර්මාණාත්මක පාඨ ලියයි. |
| **කාලච්ඡේද** | **:** | 03 යි. |
| **ඉගෙනුම් පල** | **:** | |

- අත්දැකීමක් ඇසුරින් තොරතුරු සංවිධානාත්මක ව පෙළ ගස්වයි.
- අත්දැකීම් ඇසුරෙන් නිර්මාණාත්මක පාඨ ලියයි.
- තම අත්දැකීමක් විස්තරාත්මක ව නිර්මාණාත්මක ව ලියයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- තමාගේ සැබෑ අත්දැකීමක් හෝ කාල්පනික අත්දැකීමක් පිළිබඳ තොරතුරු ශිෂ්‍යයින්ට ඉදිරිපත් කරන්න.
- එම කරුණු ගොනුකොට නිර්මාණාත්මකව ලිවිය හැකි බව පෙන්වා දෙන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම ශිෂ්‍යයන්ට ඇසෙන සේ කියවන්න.
- එහි ඇතුළත් තොරතුරු පිළිවෙලින් සංවිධානාත්මක ව විස්තර කර ඇති ආකාරය පැහැදිලි කරන්න.
- පාඩමේ ඇතුළත් දුරවබෝධ වචන පුවරුවේ ලියා ශිෂ්‍යයන් ලවා කියවන්න.
- මූලික වදන් හා පුහුණුව සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- ශිෂ්‍යයන් විසින් ලියන ලද නිර්මාණාත්මක රචනා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දෙන්න.
- අභ්‍යාස හා ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

**මූලික වදන් :**

- **විනෝද චාරිකාවක දී නැරඹීමට ගිය ස්ථාන පිළිබඳ විස්තරයක්.**

| | | |
|---|---|---|
| අලි | මඩ | ඇත. |
| මොනරු | කැලෑව | තිබේ. |
| කුරුල්ලෝ | පඳුරු | වෙයි/වෙති. |
| මුවෝ | වළවල් | සිටී/සිටිති. |
| වල් ඌරෝ | වතුර | වාසය කරයි./වාසය කරති. |
| වලි කුකුළෝ | | |
| කිඹුල්ලු | | |
| ගෝන්නු | | |

- පුහුණුව  සඳහා යොදා ගන්න.

මඩ වළවල් ඇත. මඩ වළවල් තිබේ.
වතුර වළවල් ඇත. වතුර වළවල් තිබේ.
කටු පඳුරු ඇත. කටු පඳුරු තිබේ.

යාල අභය භූමිය බලන්න ගියා.
මත්තල ගුවන්තොටුපොළ බලන්න ගියා.
හම්බන්තොට වරාය බලන්න ගියා.

මොනරු නටනවා දුටුවා. කුරුල්ලෝ පියාසර කරති.
අලි නානවා දුටුවා. මොනරු පියාසර කරති.
කිඹුල්ලු පීනනවා දුටුවා.
වල් ඌරො දුවනවා දුටුවා.

**ගුණාත්මක යෙදවුම් :**

- යාල අභයභූමියේ පින්තූරයක්
- සතුන්ගේ පින්තූර කීපයක්

**තක්සේරුව හා ඇගයීම :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- තම අත්දැකීමක් පාදක කර ගනිමින් කරුණු ගොනු කරයි.
- පින්තූර බලා තොරතුරු හඳුනා ගෙන වාක්‍ය ලියයි.
- අත්දැකීමක් ඇසුරෙන් නිර්මාණාත්මක වාක්‍ය ලියයි.
- නිර්මාණාත්මක වාක්‍ය ලිවීමට ඇති හැකියාව පිළිබඳ සතුට ප්‍රකාශ කරයි.

## වචන මාලාව

සත්තු - மிருகங்கள்
කිඹුල්ලු - முதலைகள்
අලි - யானைகள்
ගෝන්නු - மரைகள்
මොනරු - மயில்கள்
කුරුල්ලෝ - குருவிகள்
කැලෑව - காடு
මුවෝ - மான்கள்
වල් ඌරෝ - காட்டுப் பன்றிகள்
වලි කුකුළෝ - காட்டுக் கோழிகள்

**නිපුණතාව 4.0 :** පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

**නිපුණතා මට්ටම 4.3 :** ලිපි ලියයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- රාජකාරි ලිපියක ආකෘතිය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විධිමත් ලිපි ලිවීමට හුරු වෙයි.
- රාජකාරි ලිපියක ආකෘතිය අනුගමනය කරමින් ලිපි ලියයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- රාජකාරි ලිපියක් ශිෂ්‍යයින්ට පෙන්වා එහි ඇති විශේෂ ලක්ෂණ හඳුනා ගැනීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ශිෂ්‍යයින්ට පැහැදිලි කරන්න.
  - යවන්නාගේ නම, ලිපිනය හා දිනය
  - ආමන්ත්‍රණය
  - මාතෘකාව
  - අදාළ තොරතුරු (ලිඛිත භාෂාවෙන්)
  - ස්තුතිය
  - අවසානය (මෙයට, විශ්වාසී, අත්සන, නම)
- නිපුණතා මට්ටමට අදාළ පාඩම ශිෂ්‍යයින්ට ඇසෙන සේ කියවන්න.
- වාචික ප්‍රශ්න මගින් එහි ඇතුළත් තොරතුරු ශිෂ්‍යයන්ට අවබෝධ කර ගැනීමට උදවු වන්න.
- **මූලික වදන් හා පුහුණුව** සඳහා ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි අවධානය යොමු කරවන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයන් නිරත කරවන්න.

මූලික වදන් ඃ

- **(රාජකාරී ලිපියක්) වරාය නැරඹීමට අවසර ඉල්ලීමක්**

| | |
|---|---|
| වරාය අධිකාරිතුමා. | අවසර ලබා ගැනීම. |
| කළමනාකාරතුමා. | අධ්‍යාපන චාරිකාවක් |
| බස් රථය | බලාපොරොත්තුවෙන් |
| බසයේ අංකය | ස්තුතිවන්ත වෙමු. |
| ශ්‍රේණිය | පිවිසීම සඳහා |
| දිනය | නැරඹීම සඳහා |
| වේලාව | අවසර ලබා ගැනීම සඳහා |
| නැරඹීම | |
| ශිෂ්‍ය ශිෂ්‍යාවන් | |
| අත්සන | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

මහත්මයාණෙනි!

| | |
|---|---|
| විදුහල්පතිතුමනි ! | ලේකම්තුමනි! |
| අධිකාරිතුමනි! | සභාපතිතුමනි! |
| කළමනාකාරතුමනි! | අධ්‍යක්ෂතුමනි! |

මම ____________ වරාය ________ නැරඹීමට බලාපොරොත්තු ____ වෙමි.

අපි — අභය භූමිය / ගුවන් තොටුපල / මොනරු / අලි ________ නැරඹීමට බලාපොරොත්තු ____ වෙමු.

මම / අපි — ඔබගෙන් / ඔබතුමාගෙන් / අධිකාරිතුමාගෙන් / කළමනාකාරතුමාගෙන් ____________ කාරුණික ව අවසර — පතමි. / පතමු.

| | | | |
|---|---|---|---|
| මම | ඔබට | ස්තුතිවන්ත | වෙමි. |
| අපි | ඔබතුමාට | | වෙමු. |
| | ඔබ ලබාදුන් සහායට | | |
| | ඔබගේ ලිපියට | | |

**ගුණාත්මක යෙදවුම් :**

- රාජකාරි ලිපියක්
- රාජකාරි ලිපියක විශේෂ ලක්ෂණ ලියූ පත්‍රිකාවක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- රාජකාරි ලිපියක ආකෘතිය පැහැදිලි කරයි.
- විවිධ අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රාජකාරි ලිපි ලිවිය යුතු බව පිළිගනියි.
- රාජකාරි ලිපි ලියයි.

## වචන මාලාව

වරාය අධිකාරිතුමා - **துறைமுக அதிகாரி அவர்கள்**

අධිකාරිතුමනි - **அதிகாரி அவர்களே**

කළමනාකාරතුමා - **முகாமையாளர் அவர்களுக்கு**

කළමනාකාරතුමාගෙන් - **முகாமையாளரிடமே**

බස් රථය - **பஸ் வாகனம் (வண்டி)**

බසයේ අංකය - **பஸ்ஸின் இலக்கம்**

ශ්‍රේණිය - **தரம்**

දිනය - **திகதி**

වේලාව - **நேரம்**

නැරඹීම - **கண்டுகளிக்க**

අත්සන - **கையொப்பம்**

**නිපුණතාව 4.0 :** පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

**නිපුණතා මට්ටම 4.4:** තොරතුරු සහිත පාඨ ලියයි.

**කාලච්ඡේද :** 03 යි.

**ඉගෙනුම් පල :**

- අවස්ථාව හඳුනා ගෙන ලියයි.
- අවස්ථාවට ගැළපෙන පරිදි කරුණු නිරවුල් ව පෙළ ගස්වයි.
- අර්ථය ඍජු ව ප්‍රකාශ වන පරිදි තොරතුරු වාර්තා කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- ආපදා තත්ත්වය පිළිබඳ ව පුවත් පතක පළ වූ වාර්තාවක් ශිෂ්‍යයන්ට ලබා දෙන්න.
- එහි ඇතුළත් වාර්තාමය භාෂා ස්වරූපය පැහැදිලි කරන්න.
  - අදහස් කෙළින් ම ප්‍රකාශ කිරීම.
  - මූලික කරුණු පෙළ ගැස්වීම.
  - ලිඛිත භාෂාව යොදා ගැනීම.
- තමන් දුටු ආපදාවක් පිළිබඳ ව කෙටි වාර්තාවක් ශිෂ්‍යයන් ලවා ලියවන්න.
- ශිෂ්‍යයන් විසින් ලියන ලද වාර්තා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ඒවා ඇගැයීමට ලක් කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ ව පෙළපොතේ ඇති පාඩම කියවන්න.
- එහි ඇතුළත් කරුණු ශිෂ්‍යයන්ගෙන් විමසන්න.
- ශිෂ්‍යයන්ගේ ප්‍රතිචාර අගය කරන්න.
- මූලික වදන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- පෙළපොතේ පාඩම අවසානයේ ඇති ක්‍රියාකාරකම් ශිෂ්‍යයන් ලවා කරවන්න.

මූලික වදන් :

- **ආපදා තත්ත්වයක් වාර්තා කිරීම.**

| | |
|---|---|
| ගංවතුර | අවදානම |
| නායයාම් | ආපදා කළමනාකරණය |
| සුළි සුළං | හදිසි |
| අකුණු | ප්‍රාදේශීය ලේකම්වරුන් |
| සහනාධාර | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව |
| පානීය ජලය | බරපතල |
| පිසූ ආහාර | |

- **පුහුණුව සඳහා යොදා ගන්න.**

බස්නාහිරට
කෑගල්ලට
ශ්‍රී ලංකාවට

තද වැසි
ගිගුරුම් සහිත වැසි
තද සුළං
අකුණු සහිත තදවැසි

ඇති වේ.

අවතැන් වූවන්ට

පිසූ ආහාර
සහනාධාර
පානීය ජලය
වියළි ආහාර
නවාතැන්

ලබා දී ඇත.

අයහපත් කාලගුණය නිසා

විදුලිය ඇණහිට ඇත.
වාහන ගමනාගමනයට බාධා එල්ල වී ඇත.
නිවෙස්වලට ගස් කඩා වැටී ඇත.
දේපළ හානි සිදුවීමට ඉඩ ඇත.

**ගුණාත්මක යෙදවුම් :**

- ආපදාවක් පිළිබඳ ව පුවත් පතක පළ වූ වාර්තාවක්.

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- වාර්තාවක තිබිය යුතු භාෂා ස්වරූපය හඳුනා ගෙන පැහැදිලි කරයි.
- වාර්තාවකින් කිසියම් අවස්ථාවක් හෝ සිද්ධියක් පිළිබඳ තොරතුරු හෙළි වන බව පිළිගනියි.
- තමාට මුහුණු පෑමට සිදු වූ හෝ තමා ඇසූ දුටු සිද්ධි පිළිබඳ ව වාර්තා ලියයි.

## වචන මාලාව

ගංවතුර - வெள்ளப் பெருக்கு
නායයාම් - மண்சரிவு
සුළිසුළං - சூறாவளி/புயல்
අකුණු - இடி
ගිගුරුම් - இடிமுழக்கம்
බරපතල - பலத்த/கடுமையான

අපදා - அனர்த்தம்
අවදානම - ஆபத்தான
හදිසි - அவசர

නවාතැන් - தங்குமிடம்
සහනාධාර - உதவி - நன்கொடை
පානීය ජලය - குடிநீர்
පිසූ ආහාර - சமைத்த உணவு
වියළි ආහාර - உலர் உணவு

**නිපුණතාව 4.0:** පොදු සිදුවිය හැකි සහ කාල්පනික අවස්ථා ගැන සුපුරුදු මෙන් ම නුහුරු භාෂා රටාවකින් ද යුතු කෙටි සරල හා ගළපන ලද පාඨ ලියයි.

**නිපුණතා මට්ටම 4.5:** ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.

**කාලච්ඡේද :** 04 යි.

**ඉගෙනුම් පල :**

- ආකෘති පත්‍රයක තොරතුරු නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.
- ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කිරීමේ හුරුව ලබයි.
- ආකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කළ යුතු බව පිළිගනියි.
- නිවැරදි ව ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.

**පාඩම සැලසුම් සඳහා උපදෙස් :**

- ආදර්ශ ආකෘති පත්‍රයක් ඉදිරිපත් කරන්න.
- එය ශිෂ්‍යයින් සමග සාකච්ඡා කරමින් සම්පූර්ණ කරන්න.
- සියලු දෙනාගේ ම සහභාගිත්වයෙන් ආකෘති පත්‍රය (ඉල්ලුම් පත්‍රය) සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර පන්තියට ඉදිරිපත් කරන්න.
- නිපුණතා මට්ටමට අදාළ පෙළ පොතේ පාඩම ශිෂ්‍යයින්ට ඇසෙන සේ ශබ්ද නගා කියවන්න.
- මූලික වදන් හා පුහුණුව ලබා දී ඇති භාෂා භාවිතයන් කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරවන්න.
- පාඩමට අදාළ ක්‍රියාකාරකම්හි ශිෂ්‍යයින් නිරත කරවන්න.

මූලික වදන් ඃ

- **රැකියාවක් සඳහා ඉල්ලුම් පත්‍රයක් පිරවීම.**

01. සම්පූර්ණ නම ඃ

02. මුලකුරු සමග නම ඃ

03. ස්ථිර ලිපිනය ඃ

04. උපන් දිනය ඃ වර්ෂය ඃ මාසය ඃ දිනයඃ

    දිනට වයස ඃ අවු ඃ මාස ඃ දින ඃ

05. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

06. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ

07. i. පදිංචි දිස්ත්‍රික්කය ඃ

    ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඃ

08. දුරකථන අංකය ඃ

09. විද්‍යුත් තැපැල ඃ

10. අධ්‍යාපන සුදුසුකම්ඃ

    අ.පො.ස (සා. පෙළ)

    අ.පො.ස (උ.පෙළ)

11. වෘත්තීය සුදුසුකම් ඃ

12. වෙනත් සුදුසුකම් ඃ

13. පළපුරුද්ද ඃ

14. භාෂා ප්‍රවීණතාව

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවටත් නිවැරදි බවටත් සහතික කරමි.

මෙයට,

විශ්වාසී,

.......................................

අත්සන ඃ

**ගුණාත්මක යෙදවුම් :**

- පුවත් පත් දැන්වීමක පළ වී ඇති ආකෘති පත්‍රයක්

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

**පහත සඳහන් නිර්ණායක යොදා ගන්න.**

- ආකෘති පත්‍රයක ඇති තොරතුරු හඳුනා ගෙන විස්තර කරයි.
- අකෘති පත්‍ර නිවැරදි ව සම්පූර්ණ කළ යුතු බව පිළිගනියි.
- ආකෘති පත්‍ර සම්පූර්ණ කරයි.

වචන මාලාව

01. සම්පූර්ණ නම : முழுப் பெயர்

02. මුලකුරු සමග නම : முதலெழுத்துகளுடன் பெயர்

03. ස්ථිර ලිපිනය : நிரந்தர முகவரி

04. උපන් දිනය : பிறந்த திகதி වර්ෂය :வருடம் මාසය : மாதம் දිනය:

දිනට වයස : நாளில் வயது අවු : வருடம் මාස : மாதம் දින : நாள்

05. ජාතික හැඳුනුම්පත් අංකය : அடையாள அட்டையின் இலக்கம்

06. ස්ත්‍රී/පුරුෂ භාවය : பெண்/ஆண் தன்மை

07. i. පදිංචි දිස්ත්‍රික්කය : வதிவிட மாவட்டம்

ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : பிரதேச செயலாளர் பிரிவு

08. දුරකථන අංකය : தொலைபேசி இலக்கம்

09. විද්‍යුත් තැපෑල : மின்னஞ்சல் முகவரி

10. අධ්‍යාපන සුදුසුකම්: கல்வித் தகைமை

අ.පො.ස (සා. පෙළ) க.பொ.த.(சா/த)

අ.පො.ස (උ.පෙළ) க.பொ.த.(உ/த)

11. වෘත්තීය සුදුසුකම් : தொழில் தகைமை

12. වෙනත් සුදුසුකම් : ஏனைய தகைமைகள்

13. පළපුරුද්ද : அனுபவம்

14. භාෂා ප්‍රවීණතාව மொழித் திறன்

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවටත් නිවැරදි බවටත් සහතික කරමි.

மேற்குறித்த தகவல்கள் யாவும் சரியானவை என்றும், உண்மையானவை என்றும் உறுதிப்படுத்துகிறேன்.

ස්තුතියි - நன்றி මෙයට, இங்ஙனம்

විශ්වාසී, உண்மையுள்ள

අත්සන : கையொப்பம் ......................................